# THE WHITE HACKLE

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව

இலங்கை காலாட் படை சஞ்சிகை

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

www.slli.lk & www.lightinfantry.lk

**74th OCTOBER ISSUE**



## 132 වන රෙජිමේන්තු සංවත්සරය සහ හොඳම බලඇණිය තේරීමේ පෙළපාළිය








ඔක්තෝබර් මස 28 වන දින පළමු උපන් දිනය සැමරූ රෙපිමුඛ ශ්‍රීලපාහ සෙ/309401 සැරයන් අතපත්තු එඑඑස් ගේ ආදරණීය පුතුණුවන් එඑ චමෝත් සත්සර



සැප්තැම්බර් මස 25 වන දින සිව්වන උපන් දිනය සැමරූ 19 ශ්‍රීලපාහ සෙ/306117 ව/සැරයන් කොඩිතුවක්කු කේඑඑආර්ගේ ආදරණීය දියණිය දෑහැමි පහන්යා අභිමානි



අගෝස්තු මස 27 වන දින පළමුවන උපන් දිනය සැමරූ රෙම ශ්‍රීලපාහ සෙ/327044 සාසෙ චන්ද්‍ර කුමාර එස්එච්සීපී ගේ ආදරණීය පුතුණුවන් පංබජ ජනමිතු බිම්සර



16(සෙව්) ශ්‍රීලපාහ සෙ/16ඞ්00311 ලාකෝ කරුණාරත්න ඊජීජේඑඑස් ගේ ආදරණීය දියණියන් ඔක්තෝබර් මස 10 වන දින පළමු උපන් දිනය සැමරූ ගිහානි නිම්සරා සහ ගිම්හානි සත්සරනි






ඔක්තෝබර් මස 24 වන දින පළමුවන උපන් දිනය සැමරූ 17(සෙව්) ශ්‍රීලපාහ සෙ/17ඞ්00484 සාසෙ අජිත් කුමාර ජේඑම් ගේ ආදරණීය දියණිය නිමේෂා ප්‍රියදර්ශනී



සැප්තැම්බර් මස 28 වන දින හයවන උපන් දිනය සැමරූ 14(සෙව්) ශ්‍රීලපාහ සෙ/00383 කෝප්‍රල් නිශාන්ත කුමාර කේඑ ගේ ආදරණීය දියණිය ඩී කේ තුර්යා සත්සරණි



රෙපිමුඛ ශ්‍රීලපාහ සෙ/2ඞ්024980 කෝප්‍රල් දයානන්ද එච්ආර් ගේ ආදරණීය දියණියන් ඔක්තෝබර් මස 06 වන දින පළමු උපන් දිනය සැමරූ දිලාරා ශීසදි සහ නවවන උපන් දිනය සැමරූ ෂසිනි රමේෂා




අගෝස්තු මස 03 වන දින පළමුවන උපන් දිනය සැමරූ 6 ශ්‍රීලපාහ සෙ/304759 බනි II චුලවංශ එච්එඑස්ගේ ආදරණීය දියණිය පබෝදි ආක්ෂා



අගෝස්තු මස 24 වන දින සිව්වන උපන් දිනය සැමරූ 2(සෙව්) ශ්‍රීලපාහ සෙ/2ඞ්02795 කෝප්‍රල් වීරසිංහ එඩීඑස්කේ ගේ ආදරණීය පුතුණුවන් චමෝද් මධුසංක



ඔක්තෝබර් මස10 වන දින අට වන උපන් දිනය සැමරූ රෙම ශ්‍රීලපාහ සෙ/327044 සාසෙ චන්ද්‍රකුමාර එස්එච්සීපී ගේ ආදරණීය දියණිය සශ්‍රීකා බිම්සරණි

## මංගල සීනු





2012 මාර්තු මස 12 වන දින වාද්දුව හොලිඩේ රිසෝට් හිදී 8 ශ්‍රීලපාහ ඒකකයේ නි/65626 ලුතිතන් ටී එම් එල් ජී කේ තෙන්නකෝන් හා තිළිණි අනුරාධා මෙනවිය සමඟ සුබ මොහොතින් අතිනත ගන්නා ලදී.



2012 මැයි 17 දින කලුතර දෙ ා ඩ ම් ගෙ ාඩ නිවසේදී නදිල්කා දුලාශිනි මෙනවිය සමඟ වසනාවන්ත යුග දිවියට පා තැබූ 25 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/317270 කෝප්‍රල් නුවන් ඩබ්ලිව්එ

# THE WHITE HACKLE

74th Issue October 2012 www.slli.lk & www.lightinfantry.lk

Pioneer Sri Lanka Army Quarterly and the Journal of the Sri Lanka Light Infantry

## CONTENTS

PAGE


- අදහස් උදහස් හා විවේචන 02
- සේවයේ යෙදී සිටියදී මියගිය අයට ගෞරවය දැක්වීම සඳහාය 03
- රෙජිමේන්තු අධිපති තුමාගේ රෙජිමේන්තු සංවත්සර පණිවුඩය 04
- යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි ගේ ඒකක සංචාරය 05
- ඒකමුතුවෙන් තවත් සමාජ සත්කාරයක් 06
- 6 ශ්‍රීලපාහ නිවාඩු නිකේතනය 07
- 14 (සේවි) ශ්‍රීලපාහ සාර්ථක බළඇණි පුහුණුවීම් නිමාව 08
- මොණරවැව විහාරස්ථානයට නව ආවාස ගෙයක් 09
- 8 ශ්‍රීලපාහ පූජා සත්කාර 10
- බළඇණි පුහුණුවීම් නිමකළ 26 ශ්‍රීලපාහ 11
- සේවාවනීතා විත්ති 12 - 13
- අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ අවසන් අධියර - 4 ශ්‍රීලපාහ 14
- ඩෙංගු වසංගතය මර්ධනයට 8 ශ්‍රීලපාහ දායකත්වය 15
- ශ්‍රීලපාහ පුහුණු පාසලට නව බුද්ධ මන්දිරයක් 18
- ලෝක ජූඩෝ දිනය 19
- රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ 132 වන සංවත්සරය 20 - 22
- තෙවන සංවත්සරය - 23 ශ්‍රීලපාහ 23
- 23 ශ්‍රීලපාහ නව අණදෙන නිලධාරී 24
- අන්තර් රෙජිමේන්තු ආධුනික ජූඩෝ තරඟාවලියේ අනු ශූරතාවය ශ්‍රීලපාහ රෙජිමේන්තුවට 25
- 16 ඒජාසාසාබ අණදෙන නිලධාරී 27
- පෙර දැනුමෙන් සන්නද්ධව සේවය කරමි කිත් පැසසුම් මැද 30
- 4 ශ්‍රීලපාහ ඒකකයෙන් තවත් පූජා සත්කාරයක් 35
- කල් අරබේ සිට 38
- දසුනේ හසුන 39
- ප්‍රහේලිකා අංක 51 39-40




09 නිර්මල බුදු දහමට මුල් තැනයි ....



14 අපි සැවොම ශ්‍රී ලාංකිකයෝ ...



32 අපේ හෙට අනාගතය ඔබයි ...




### කවරයේ කථාව

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු නඟා සිටුවා වසර 132 ක් සපිරීමට සමගාමීව 2012 ඔක්තෝබර් මස 19 වන දින සිට 23 දින දක්වා රෙජිමේන්තු අධිපති ඇතුලු සියලුම නිලයින්ගේ සහභාගිත්වයෙන් උත්සව මාලාවක් සංවිධානත්මකව පැවැත් වූහ. 2012 ඔක්තෝබර් මස 23 වන දින රාත්‍රියේ පැවති සම්මාන පෙළපාළියේදී හොදම බළඇණි තේරීමේ උත්සවය පැවැති අතර ඒහිදි හොඳම නිත්‍ය හා ස්වෙච්ඡා බළඇණි මෙන්ම හොඳම රෙසැමේ වෙත හිමි කුසලාන රෙජිමේන්තු අධිපති තුමන්ගේ සුරතින් ලබාගත් මොහොත.

Printed by

107D, Havelock Road, Colombo 05.
Tel : 011 2502295, 2502134, 2502135
www.softwave.lk

# THE WHITE HACKLE

SRI LANKA
LIGHT INFANTRY QUARTERLY


### Colonel of The Regiment

**Maj Gen** RMD Rathnayake RWP RSP USP ndu psc

### Centre Commandant

**Col** KJ Jayaweera RSP

### The White Hackle Editorial

**Editor in Chief**

Col KJ Jayaweera RSP

**Assistant Editors**

Maj AB Dodamwela SLLI

(ADJUTANT RHQ SLLI)

Maj KKIA Kumara SLLI

(Officer In Charge 'The White Hackle' RHQ SLLI)

**Chief Consultant**

Maj Gen RMD rathnayake RWP RSP USP ndu psc

**Honourary Consultants**

Maj Gen HV Athukorale VSV psc FBIM

(Rtd – Reg Force)

Brig AER Abeyesinghe KSV

(Rtd – Vol Force)

**Computer Type setting & Designed**

SGT Gunasiri SHIUK- 7SLLI

Publisher - Regimental Centre
Sri Lanka Light Infantry

Telephone - 0112855204
0112855356 - 60

Ext - 57656

Fax - 0112855204

E-mail - editor.whitehackle@gmail.com
editor.whitehackle@yahoo.com

Website - www.slli.lk
www.lightinfantry.lk


# Feedback

## අදහස්, උදහස් හා විවේචන
## Readers Please Write in

The WHITE HACKLE the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 74th issue. This quarterly is for Members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals to be achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil and English). What is valued is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through 'THE WHITE HACKLE', the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience, go ahead and write in to 'THE WHITE HACKLE' We are willing to accept and publish. We are happy to hear you and consider your contribution in any form; sketches, cartoons, stories, poems and whatever comes from your thoughts and your pen.

Our Motto is " Ich Dien", " I Serve". Let 'White Hackle' be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all the very best.

-Editor-

### කතු වැකිය

ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් නිත්‍ය හා ස්වේච්ඡා බළඇණි තුළ ඇති කරන්නා වූ තරඟකාරිත්වය තුළින් ඒකකයන් හි පොදු කටයුතු, ප්‍ර, පාලන, භකාස කටයුතු හා ක්‍රීඩා කටයුතු තුළ සීඝ්‍ර දියුණුවක් ඇති කිරීම හා දේශයේ අභිමානය ශ්‍රී ලංකා යුද හමුදාව තුළ ආදර්ශමත් පාබල හමුදාවක් බිහි කිරීම වෙනුවෙන් ඉතා උසස් වූ රාත්‍රී සම්මාණ පෙළපාළියක් පැවැත්වීමෙන් අන් රෙජිමේන්තු වෙත යුද හමුදාවේ පැරණිතම රෙජිමේන්තුවෙන් ලබාදුන්නේ ඉතා වටිනා ආදර්ශයකි.

කීර්තිමත් යුද හමුදා ඉතිහාසයේ පාබල හමුදා වෙත හිමිවන්නා වූ විශිෂ්ට නාමය එය 1881 අප්‍රේල් මස 01 වන දින සිට මහා රාජිනී වර්ණයන් හා රෙජිමේන්තු වර්ණයන්ගෙන්ද ඉන් පසු 1978 වර්ෂයේදී ජනාධිපති හා රෙජිමේන්තු වර්ණයන්ගෙන්ද පිදුම් ලැබුවේ අපගේ රෙජිමේන්තුව වෙනුවෙන් බිහිවූ ඒ විශිෂ්ටයින් නිසයි. ඔවුන්ගේ අඩි පාරේ යමින් රට වෙනුවෙන් ජාතිය වෙනුවෙන් කුරිරු යුද්ධය තුළින් නිල දරුවන් හා සෙසුනිලයින් 4000ක ට ආසන්න ප්‍රමාණයක් තම ප්‍රාන දානය ලක්මැණී වෙත කැපකරනු ලැබුයේ ඒ අභිතත්වයෙණි. එසේම කාය දානයෙන් තම අත් පා ජාතිය වෙනුවෙන් කැප කළ සෙස්සෝ බොහෝය. ඔවුනගේ අද දිනය රට ජාතිය වෙනුවෙන් කැප කළේ ඉමහත් භක්තියෙණි.

මෙවන් කැප කළ අප රෙජිමේන්තුව වෙනුවෙන් අද දින අප සියලු දෙනා ඉතා විශ්ෂ්ට අන්දමින් කැපවීම් කළ යුතුය. එය අනාගතයේ මෙම රෙජිමේන්තුව බබලවන්නට කරන්නා වූ කාර්යයක් මෙන්ම තම උපන් මව්බිමට, ජාතියට හා ආගමට කරන්නා වූ ආයෝජනයකි. අප සැම මාසිකව වැටුපක් ලබන්නේ ගමේ නගරයේ සිටින දුප්පත් පොහොසත් බේදයක් නොමැතිව මහන්සියෙන් උපයනා ජනතාවගේ මුදලින් බැව් මොහොතකටවත් අමතක කළ යුතු නැත. එම නිසා මෙම විශිෂ්ට රෙජිමේන්තුවේ විශිෂ්ට සාමාජිකයෝ වශයෙන් අද සිට කැප වී වැඩ කරන්නට අධිටන් කරගත යුතුය.

The White Hackle is published quarterly under the supervision of the Regimental Centre Commandant to educate the Sri Lanka Light Infantry Officers and men on various topics including news, information on activities, people, policies, operations, technical developments, views, opinions and ideas to satisfy their reading thirst. Manuscripts of interest to the Regiment are invited. Direct Communication is authorized. The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 0112855204 or 0112855356-60 Extn. 57656. Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. Publication of this periodical is authorized by the Dte, of PA Army HQ CBO by letter No. A/275/27 of 16 Mar, 94. Use of funds for printing of this Publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conference held at Welioya.

## සේවයේ යෙදී සිටියදී මියගිය රණවිරුවන්ට ගෞරව දැක්වීම සඳහාය

## IN HONOUR OF THOSE SLLI HEROES WHO MADE THE SUPREME SACRIFICE

**1983 වසරේ සිට මව්බිමේ ඒකීය භාවය වෙනුවෙන් දිවි පුද කළ ශ්‍රීලපාහ විරෝදාර රණවිරුවන් හට ගෞරව දැක්වීමක් වශයෙන් ඔවුන්ගේ නාමලේඛනය 1999 ජනවාරි කලාපයේ සිට කොටස් වශයෙන් පහත සඳහන් පරිදි පළ කරනු ලැබේ.**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3501 | S/167408 | L/Cpl | Bandara WMC | 4 SLLI | Wishwamadu | 31/01/2009 |
| 3502 | S/319935 | L/Cpl | Jayanath HNKCR | 4 SLLI | Wishwamadu | 31/01/2009 |
| 3503 | S/318079 | L/Cpl | Somarathna PAP | 7 SLLI | Wishwamadu | 31/01/2009 |
| 3504 | S/319986 | L/Cpl | Sarathchandra W | 4 SLLI | Wishwamadu | 31/01/2009 |
| 3505 | S/312022 | L/Cpl | Kapilarathna YRIGN | 4 SLLI | Wishwamadu | 31/01/2009 |
| 3506 | S/17D00342 | L/Cpl | Ruwan Kumara UGA | 17(V)SLLI | Wishwamadu | 31/01/2009 |
| 3507 | O/62766 | Maj | DR Fernando SLLI | 15 SLLI | Iranamadu | 01/02/2009 |
| 3508 | S/15880 | Wo 1 | GAC Hemantha | 15 SLLI | Iranamadu | 01/02/2009 |
| 3509 | S/309920 | Sgt | Premakumara DDS | 15 SLLI | Iranamadu | 01/02/2009 |
| 3510 | S/317506 | Cpl | Rathnayaka RNC | 15 SLLI | Iranamadu | 01/02/2009 |
| 3511 | S/317514 | Cpl | Ruwankumara PSJ | 15 SLLI | Iranamadu | 01/02/2009 |
| 3512 | S/2D03381 | L/Cpl | Bandara KGS | 15 SLLI | Iranamadu | 01/02/2009 |
| 3513 | S/186103 | L/Cpl | Wanasinghe WPMS | 15 SLLI | Iranamadu | 01/02/2009 |
| 3514 | S/321959 | L/Cpl | Saman Kumara KW | 15 SLLI | Iranamadu | 01/02/2009 |
| 3515 | S/40264 | L/Cpl | Pradeep Kumara KAR | 15 SLLI | Iranamadu | 01/02/2009 |
| 3516 | S/307039 | Sgt | Perera DJ | 15 SLLI | Iranamadu | 01/02/2009 |
| 3517 | S/202429 | L/Cpl | Pushpakumara DHMC | 15 SLLI | Iranamadu | 01/02/2009 |
| 3518 | S/321203 | L/Cpl | Rathnayaka RMJK | 15 SLLI | Iranamadu | 01/02/2009 |
| 3519 | S/203493 | L/Cpl | Bandara GKR | 15 SLLI | Iranamadu | 01/02/2009 |
| 3520 | S/321964 | L/Cpl | Siril LG | 15 SLLI | Iranamadu | 01/02/2009 |
| 3521 | S/301963 | Sgt | Wanasinghe WAPK | 6 SLLI | Chalei | 02/02/2009 |
| 3522 | O/4086 | Lt Col | LC Marabage SLLI | 17(V)SLLI | Iranamadu | 02/02/2009 |
| 3523 | S/319941 | Cpl | Pushpakumara KA | 19 SLLI | Ampakamam | 02/02/2009 |
| 3524 | S/5D02619 | Cpl | Saman rathnayaka RMC | 15 SLLI | Mullaitivu | 02/02/2009 |
| 3525 | S/317456 | Cpl | De Silva HAS | 4 SLLI | Wishwamadu | 02/02/2009 |
| 3526 | S/320770 | L/Cpl | Sadaruwan LMJ | 8 SLLI | Wishwamadu | 03/02/2009 |
| 3527 | S/321009 | L/Cpl | ranasinghe RADP | 8 SLLI | Wishwamadu | 03/02/2009 |
| 3528 | S/5D02765 | Cpl | Sanjeewa Kumara HTAP | 15 SLLI | Iranamadu | 03/02/2009 |
| 3529 | S/302866 | Sgt | Dipal Kumara CHN | 7 SLLI | Wishwamadu | 03/02/2009 |
| 3530 | S/202014 | L/Cpl | Nilantha Kumara WMD | 7 SLLI | Wishwamadu | 03/02/2009 |
| 3531 | S/204950 | L/Cpl | Gunawardena DMN | 7 SLLI | Wishwamadu | 03/02/2009 |
| 3532 | S/321151 | L/Cpl | Aththanayaka AK | 15 SLLI | Mullaitivu | 03/02/2009 |
| 3533 | S/321185 | L/Cpl | Sampath Kumara W | 15 SLLI | Mullaitivu | 04/02/2009 |
| 3534 | S/319686 | L/Cpl | Premawardena RTGSKS | 7 SLLI | Wishwamadu | 07/02/2009 |
| 3535 | S/44225 | L/Cpl | Pushpakumara PMC | 20 SLLI | Iranamadu | 07/02/2009 |
| 3536 | S/304345 | S/Sgt | Bandara RMSS | 11 SLLI | G H Kandy | 08/02/2009 |
| 3537 | S/194709 | L/Cpl | Herath HMKB | 15 SLLI | Pudukudierippu | 08/02/2009 |
| 3538 | O/307147 | Lt | NAC Nissanka SLLI | 15 SLLI | Pudukudierippu | 08/02/2009 |
| 3539 | S/317517 | Cpl | Suranga KP | 15 SLLI | Pudukudierippu | 08/02/2009 |
| 3540 | S/170393 | L/Cpl | Ruwan Prasanna NNMPG | 4 SLLI | G H ANP | 08/02/2009 |
| 3541 | S/317713 | Cpl | Kumarasinghe KIN | 8 SLLI | Wishwamadu | 09/02/2009 |
| 3542 | S/202353 | L/Cpl | Wijesundara HPDA | 11 SLLI | Mullaitivu | 10/02/2009 |
| 3543 | S/320628 | L/Cpl | Kumara CNS | 8 SLLI | Mullaitivu | 10/02/2009 |
| 3544 | S/320478 | L/Cpl | Siriwardena HMCL | 11 SLLI | Wishwamadu | 10/02/2009 |
| 3545 | S/185980 | L/Cpl | Saman Kumara PMD | 10 SLLI | Wishwamadu | 10/02/2009 |
| 3546 | S/203899 | L/Cpl | Pushpakumara RMJ | 4 SLLI | G H Kurunegala | 11/02/2009 |
| 3547 | S/314262 | L/Cpl | Saman ra | 11 SLLI | Wishwamadu | 11/02/2009 |
| 3548 | S/191370 | L/Cpl | Chandra Kumara DHRS | 11 SLLI | G H ANP | 12/02/2009 |
| 3549 | O/309933 | Lt | GHI Ganhewa SLLI | 15 SLLI | Pudukudierippu | 13/02/2009 |
| 3550 | S/208396 | L/Cpl | Indika TWR | 20 SLLI | Pudukudierippu | 13/02/2009 |

තව කොටසක් ලබන කලාපයේ

## රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාවේ
## 132 වන සංවත්සරය වෙනුවෙන්
## රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින් නිකුත් කරනු ලබන පණිවුඩය

ශ්‍රී ලංකා යුද හමුදාවේ ආරම්භක බළඇණිය වන 1881 සිට මේ දක්වා වසර 132 කට වැඩි ඉතිහාසයකට උරුමකම් කියන අප ශ්‍රී ලංකා පාබල හමුදාව වර්තමාන අවශ්‍යතාවයට ගැලපෙන පරිදි රෙජිමේන්තුවක් ලෙස සංවිධානය වී 2012ක් වූ ඔක්තෝබර් මස 23වන දිනට වසර 23ක් සම්පූර්ණ කරයි. මේ සුවිශේෂි අවස්ථාවේ රෙජිමේන්තු අධිපති වශයෙන් ඔබ සැම වෙත සුබ පැතුම් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සළකමි.

රෙජිමේන්තු සංවත්සරය සමරන මේ අමරණීය අවස්ථාවේ අප රෙජිමේන්තුව නිත්‍ය බළඇණි 15ක් ද, ස්වෙච්ඡා බළඇණි 8ක් ඇතුලුව රෙජිමේන්තු මූලස්ථාන බළඇණියකින් ද, සමන්විත වේ. මෙහිදී අප දේශයේ ඒකීය භාවය වෙනුවෙන් ජීවිත පූජා කළ අප රෙජිමේන්තුවේ සියලු රණවිරුවන් ප්‍රථමයෙන් අප ඉතා භක්ති ප්‍රණාමයෙන් යුතුව සිහිපත් කරන්නෙමු. පසුගිය වසර වලදී යුද්ධයට දායක වී රට වෙනුවෙන් දිවිපිදූ ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් සියලුම රණවිරුවන් උදාරයි ඔබ වැඩසටහන යටතේ ඇගයීමට ලක් කිරීමට හැකි වූ වග මා මෙම අවස්ථාවේ අභිමානයෙන් යුතුව සිහිපත් කරමි. තවද ගෙවී ගිය වසර තුළ එම රණවිරුවන් සදා අනුස්මරණය කිරීම සඳහා ඉදි කිරීමට සැලසුම් කළ ස්මාරකයේ ඉදි කිරීම් ඔබ සියලු දෙනාගේ දායකත්වය මත අඩක් නිම කිරීමට හැකි වූ බවද සතුටින් දන්වා සිටිමි. එළඹෙන වසර තුළ මෙම ස්මාරකයේ සියලු කටයුතු ඔබ සැමගේ කැපවීම හා පරිත්‍යාග මත නිම කිරීමට හැකිවනු ඇතැයි මා තුළ දැඩි විශ්වාසයක් පවතින බව ප්‍රකාශ කරමි.

එමෙන්ම ක්‍රීඩා කුසලතා සහ අනෙකුත් ක්‍රියාදාමයන් තුළින් අපගේ විශිෂ්ට මූලාශ්‍ර එක් කළ අප රෙජිමේන්තුවේ සේවය කළ සියලුම නිලධාරීන් සහ සෙසුනිලයින්ද ඉතා ගෞරව අභිමානයෙන් යුතුව සිහිපත් කරමි. රට තුළ පැවති ත්‍රස්තවාදී ක්‍රියා සමථයකට පත්කර සාමකාමී වාතාවරණයක් දක්වා අවතීර්ණ වීම යටතේ සිදු වූ සෑම ක්‍රියාකාරකමකදීම අප රෙජිමේන්තුවට අයත් නිලධාරින් හා සෙසුනිලයින් ඇපකැප වී රාජකාරී කර ඇති බව ඔබ අප කවුරුත් දන්නා කරුණකි. රෙජිමේන්තුවක් වශයෙන් අප මේ වන විට රටේ සංවර්ධන ක්‍රියාවලියට පන්නරයක් ලබා දෙමින් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීමේ ජාතික සැලැස්ම සඳහා ශ්‍රම පරිත්‍යාගයෙන් දායක වී සිටී. යුදමය තත්ත්වය සමකාමී තත්ත්වයකට අවතීර්ණ වී, අප ක්‍රීඩාමය වශයෙන් පසුගිය වසර තුළ විශාල වශයෙන් උසස් ලෙස දක්ෂතා දක්වා ඇති බැවින්, ඉදිරියේදී ද එම ක්‍රීඩා කුසලතා වැඩි දියුණු කර ගැනීම සඳහා ඔබ සැවොම මනා කැපවීමෙන් ඒ සඳහා අදිටන් කරගත යුතුය.

තවද යුද හමුදාව වෘත්තීයමය වශයෙන් ඉහළ තත්ත්වයකට පත් කිරීමට කටයුතු සම්පාදනය කරමින් පවතින බැවින් මෙම රෙජිමේන්තුවට අයත් සියලුම නිලධාරින් හා සෙසුනිලයින් ඒ සඳහා ඇපකැප වී වෘත්තීය නිපුණතාවය හා තම ක්ෂේත්‍රයේ දැනුම වර්ධනය කර ගැනීම සඳහා විධිමත්ව කටයුතු කළයුතු බැව් දන්වා සිටින අතර, ඉදිරියේදී ඒ සඳහා පැවැත්වීමට නියමිත පාඨමාලා සඳහා සහභාගි වී දැනුම වර්ධනය කර ගැනීමට කටයුතු කළයුතු බවට දන්වා සිටිමි.

අප සේවය කිරීමට කැප වූ රෙජිමේන්තුවක් බැවින් ''සේවය කරමි'' යන උදෘත පාඨය පෙරටුව වීරෝධාර රණවිරුවන් ලෙස අවංකව ඇපකැප වී ඉදිරියේදී සේවය කරනු ඇතැයි මා තරයේ විශ්වාස කරන අතර, ඒ සඳහා විනය හා පැවැත්ම ඉතා උසස් අන්දමින් පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙසත් අවංකවම ඇපකැප වී සේවය කිරීමට අදිටන් කරගත යුතු බවත් මෙහිදී සඳහන් කරනු කැමැත්තෙමි.

අවසාන වශයෙන් ඔබ සියලු දෙනාටත් ඔබගේ පවුල් වල සියලුම ඥාතීන්ටත් රාජකාරින්හි යෙදී සිට මාතෘභූමිය වෙනුවෙන් ප්‍රාන දානය දුන් වීරෝධාර රණවිරුවන්ගේ පවුල්වල ළඟම ඥාතින්ටත් කාය දානය දුන් රණවිරුවන්ටත් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ටත් අප සමඟ එකට අත්වැල් බැඳගනිමින් රාජකාරින් ඉටු කරනු ලබන සිවිල් සේවක මහතුන්ටත් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ටත් ත්‍රිවිධ රත්නයේ පිහිට හා ආරක්ෂාව නිරෝගි සුවය ප්‍රාර්ථනා කරමි.

ඔබ සැමට තෙරුවන් සරණයි

ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී
මේජර් ජෙනරාල්
රෙජිමේන්තු අධිපති ශ්‍රී ලංකා පාබල හමුදාව

2012 ඔක්තෝබර් මස 23 දින.

# යුද හමුදා මාණ්ඩලික ප්‍රධානිගේ ශ්‍රීලපාහ ඒකක සංචාරය

## 6 ශ්‍රීලපාහ





මෙම ඒකකය ආරම්භ කර එහි නියමුවන් අතරේ දෙවනුව අණදෙන නිලධාරි ලෙස අණදීමේ නව පන්නරයක් ලබාදුන් යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි හා ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී 2012.10.02 වන දින මෙම ඒකක කඳවුරු පරිශ්‍රයේ සංචාරයක නිරතවන ලදී. මෙම කඳවුරේ ඉදි වන ප්‍රධාන දොරටුව, හටනිවාස සංකීර්ණය, වැසිකිලි පද්ධතිය, ස්නානය කිරීමේ ජලටැංකි පද්ධතිය, නව කොනොනි සමාජශාලා ගොඩනැගිල්ල නවීන පහසුකම් වලින් සමන්විතව ඉදි වන නව නිලධාරි නිවස්නය, සිමෙන්ති ගල් ව්‍යාපෘතිය, කාබනික පොහොර නිෂ්පාදන අංශය හා නවතමයෙන් ආරම්භ කරන ලද අක්කර 05 ක් විශාල ගොවිපල නිරීක්ෂණය කරන ලද අතර, එම කටයුතු තව දුරටත් ඉතා උසස් අන්දමින් කරගෙන යාමට අවශ්‍ය උපදෙස් අණදෙන නිලධාරි මේජර් කේජ් පුෂ්පකුමාර ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ වෙත ලබාදී කඳවුරෙන් නික්ම යන ලදී.

'ප්‍ර' ශාඛාව 6 ශ්‍රීලපාහ





## 7 ශ්‍රීලපාහ

වසර තිහකට ආසන්න කාලයක් කුරිරු ත්‍රස්තවාදින්ගේ ග්‍රහනයට නතුවී තම සිතුම් පැතුම් හා නිදහස් නිවහල් භාවය කැප කළ උතුරුකරයේ වෙසෙන්නා වූ ජනයාගේ ජන ජීවිතය දිනෙන් දින ආලෝකමත් වන මෙවන් අවධියක කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ජන ජීවිතය ජන සංවර්ධනය පිටුපස සිටින යෝධ සෙවනැල්ල වූ යුද හමුදා හටපිරිස් අතුරින් 7වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව විසින් යුද හමුදා මාණ්ඩලික ප්‍රධානිගේ උපදෙස් මත අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් අනිල් සෝමවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහගේ මග පෙන්වීම යටතේ නිලධාරි හා සෙසුනිලයන්ගේ ප්‍රයෝජනය සඳහා අභිනවයෙන් ඉදි වූ නිවාඩු නිකේතනයේ වත්මන් තත්ත්වය පිළිබඳ සොයා බැලීම සඳහා යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි හා ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී කිලිනොච්චි ප්‍රදේශයේ සංචාරය කරන ලදී. එහිදි නිවාඩු නිකේතනය සකස් කිරීම සඳහා දායක වූ සියලු දෙනාහට ස්තුතිය පුද කරන ලදී. මේ අවස්ථාව සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (කිලි) ආඥාපති සහ 57 වන සේනාංකාධිපති තුමන්ලා සහභාගි වූහ.

බුද්ධි අංශය 7 ශ්‍රීලපාහ

# එකමුතුවෙන් තවත් සමාජ සත්කාරයක්



තිස් වසරක යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙසින් එදා එල්ටීටී සංවිධානය විසින් කිලිනොච්චි ජයන්ති නගර් පිහිටා තිබූ මහා දේව ආශ්‍රම ළමා නිවාසයේ සර්ව ශක්ති අම්මාන් කෝවිල විනාශ කර තිබූ අතර, එම ළමා නිවාසයේ 350ක පමණ ළමුන්හට නිවාසය තුළ කෝවිලක් නොමැති කමින් ආගමික කටයුතු සඳහා ප්‍රදේශයේ වෙනත් කෝවිලක් වෙත යාමට සිදු විය. මෙම අවශ්‍යතාවය වටහාගත් කිලිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීවීඩීයූඒ පෙරේරා ආර්එස්පී යූඑස්පී පීඑස්සී විසින් මෙහි සම්බන්ධීකරණ කටයුතු සඳහා මුලාරම්භය ගෙන කටයුතු කළේය. ඒ සඳහා අවශ්‍ය මුල්‍ය ධනය එරික් අම්බළන්ගොඩ මහතා විසින් පරිත්‍යාග කරන ලදී.



ආසේමු ආඥාපතිතුමාගේ මේ මහගු කාර්යය වඩාත් සාර්ථකවත්ව හා ඉතා අලංකාරවත්වත් ලෙස ඉදි කිරීමට සම්පූර්ණ වගකිම 7 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එච්වීජ් සෝමවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ වෙත පවරන ලදී. මෙම ඉදි කිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම 11 ඉසේරෙ වෙතින් ලබාගෙන අණදෙන නිලධාරි ඇතුලු ඒකකයේ සියලුම නිලයින් දිවා රෑ නොබලා කළ කැපවීමේ ප්‍රතිඵලයක් ලෙස නවීකරණ කටයුතු මාස එකහමාරක් වැනි කෙටි කාලයක් තුළ සිදු කිරීමට හැකිවීම කාගෙත් අවධානයට හා ප්‍රසංශාවට ලක්විය.





මෙම ළමා නිවාසයේ සෙවන ලබන ළමා සිත් වලට සිනහව නංවමින් අලංකාරවත් සර්ව ශක්ති අම්මාන් කෝවිල එම දරුවන් හට ප්‍රදානය කිරීම රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශ ගරු ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ගේ හා ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ජේ ජයසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් 2012.09.29 දින ඉතා උත්කර්ෂවත් ලෙස පවත්වන ලදී. මෙම කාර්ය ආරක්ෂක ලේකම් තුමා හා යුද හමුදාපති තුමන් මෙන්ම එම අවස්ථාවට පැමිණ සිටි උසස් නිලධාරින්ගේ මෙන්ම ප්‍රදේශ වාසින්ගේ ද මහත් පැසසුමට ලක්විය.

මහා දේව ආශ්‍රම ළමා නිවාසයේ සභාපතිතුමාගේ මෙන්ම ප්‍රදේශ වාසින්ගේ ද මහත් පැසසුමට ලක් වූ මෙම කාර්ය කිරීමට ශක්තියක් වූ කිලිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති තුමාටත්, 7 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ඇතුලු සියලුම අයවළුන්ටත්, 11 ඉසේරෙ අණදෙන නිලධාරි ඇතුලු අයවළුන්ටත්, මුල්‍ය ධනය ලබාදුන් එරික් අම්බළන්ගොඩ මහතාටත්, මෙවන් අසරණ වූ ළමුන් පිරිසක් වෙනුවෙන් කළ අසීමිත කැපවීමට ඒ කුඩා සිත් දසදහස් වරක් ස්තූතිවන්ත වනවා ඇත.

**බුද්ධි අංශය 7 ශ්‍රීලපාහ**





# 6 ශ්‍රීලපාහ නිවාඩු නිකේතන

අනුරාධපුරය මිහින්තලේ තන්තිරිමලේ වැනි පූජනීය සිද්ධස්ථාන වැඳපුදා ගැනීමට පැමිණෙන ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානයට සහ ශ්‍රීලපාහ ඒකක වලට අයත් නිලධාරී සෙසුනිලයින්ගේ සහ පවුල්වල සමාජිකයින්ගේ සුබ සාධක කටයුත්තක් සේ සලකා ඒකකයේ නිලධාරින් හා සෙසුනිලයින්ගේ ධන හා ශ්‍රම පරිත්‍යාගයෙන් මේ වනවිට නිවාඩු නිකේතන 03 ක් මහකනදරාව වැව් ඉස්මත්තේ ඉදිකර ඇති අතර, එමගින් සහනදායී මිල ගණනකට සීමා වන පරිදි නවාතැන් පහසුකම් සපයාදීමට සුදානම් කර ඇති බව ඉතා සතුටින් සදහන් කරමු.

අනුරාධපුරය හා මිහින්තලේ ප්‍රදේශ අවට ඇති නිවාඩු නිකේතන මෙන්ම විශ්‍රාමශාලා වලට වැඩි මුදලක් ගෙවා ලබාගන්නා නවාතැන් පහසුකම් නිසාවෙන්ම අණදෙන නිලධාරිතුමාගේ අධීක්ෂණය යටතේ මෙවැනි පියවරක් ගන්නා ලද බව සදහන් කරන අතරම, පිටස්තර ස්ථාන වලින් එවැනි පහසුකම් සඳහා අයකරනු ලබන ගාස්තු වලින් හරි අඩකටත් වඩා අඩු මුදල් ප්‍රමාණයක් ගෙවීමෙන් සුන්දර පරිසරයක් තුළ ඉදි වූ මෙම නිවාඩු නිකේතන 03 න් නවාතැන් පහසුකම් ලබා ගන්නේ නම් එමගින් ඇති වන පහසුව මෙන්ම ප්‍රදේශයේ ඇති නිශ්කලංකභාවය හා පරිසර හිතකාමීත්වය මනාව පැහැදිලි වනු ඇත.

සියලුම ගෘහ භාණ්ඩ, විදුලි පංකා, රූපවාහිණි යන්ත්‍ර



**ලේක්විව් නිවාඩු නිකේතනය**

වලින් සමන්විත මෙම නිවාඩු නිකේතන වෙන්කරවා ගැනීමේදී අයකරනු ලබන මුදල් ප්‍රමාණයක් පහත සදහන් පරිදි වන අතර, මිහින්තලේ නගරයේ සිට හොරොව්පතාන මාර්ගයේ පැමිණ වේලන්කුලම හන්දියෙන් වමට හැරී මීටර් 950 ක් පමණ ඉදිරියට පැමිණෙන විට මෙම නිවාඩු නිකේතන 03 පිහිටි මෙම ඒකක මුලස්ථානය දක්නට ලැබෙන බව සදහන් කරමු.

මෙම නිකේතන සදහා පාබල හමුදා සාමාජිකයා සමග ඔහුගේ ළගම ඥාතීන් පැමිණෙන්නේ නම් පමණක් මෙම මිල ගණන් පනවා ඇති අතර, වෙනත් සිවිල් පුද්ගලයින් ගෙන්වන්නේනම් ඉහත මිල ගණන් වලට අමතරව එක් කාමරයක මිල රුː 150.00 ක මුදලකින් වැඩිවනු ඇත.

නිවාඩු නිකේතන තුළින් නවාතැන් පහසුකම් ලබාගැනීමේදී ඔබට අවශ්‍ය ආහාරපාන ඉතාමත් සහනදායි මිලකට ලබාගත හැකි බවද සතුටින් දන්වා සිටිමු.

එසේ මෙම ඒකක නිවාඩු නිකේතන වෙන්කරවා ගැනීමට අවශ්‍ය වන්නේ නම් දක්වා ඇති දුරකථන අංක වලින් විමසීම් කර හෝ මුලස්ථානය 6 ශ්‍රීලපාහ යුද හමුදා කඳවුර මහකනදරාව මිහින්තලය යන ලිපිනයේ පිහිටි කඳවුරු පරිශ්‍රය වෙත පැමිණ විස්තර ලබාගැනීමට හැකියාව ඇත.

බුද්ධි අංශය 6 ශ්‍රීලපාහ

**ලේක්විව් නිවාඩු නිකේතනය**

| | | |
|---|---|---|
| එක් කාමරයක් සදහා | රුː | 600.00 |
| නිකේතන උද්‍යානය සමග කාමර 04 සදහා අයකරනු ලබන මුදල | රුː | 2500.00 |

**ෆීල්ඩ්විව් නිවාඩු නිකේතනය**

| | | |
|---|---|---|
| එක් කාමරයක් සඳහා අයකරනු ලබන මුදල | රුː | 600.00 |
| නිකේතන උද්‍යානය සමග කාමර 03 සදහා අයකරනු ලබන මුදල | රුː | 2000.00 |

**ග්‍රීන්විව් නිවාඩු නිකේතනය**

| | | |
|---|---|---|
| එක් කාමරයක් සඳහා අයකරනු ලබන මුදල | රුː | 600.00 |
| නිකේතන උද්‍යානය සමග කාමර 03 සදහා අයකරනු ලබන මුදල | රුː | 2000.00 |

**දුරකථන අංක**

| | | |
|---|---|---|
| 0253259130 | - | විධායක අධිකාරි 6 ශ්‍රීලපාහ |
| 0113154520 | - | මුලස්ථානය 6 ශ්‍රීලපාහ |
| 0213737978 | - | බනි/සැර නිවස්නය 6 ශ්‍රීලපාහ |



**ෆීල්ඩ්විව් නිවාඩු නිකේතනය**



**ග්‍රීන්විව් නිවාඩු නිකේතනය**

# 14 (සෙව්) ශ්‍රීලපාහ බළඇණි සාමුහික පුහුණුවීම් සාර්ථකව නිමා වෙයි



14 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ චුන්ඩිකුලම් අලිමංකඩ ප්‍රදේශයේ ස්ථානගතව සිටින අතර, 2012.06.25 දින සිට 2012.07.31 දින දක්වා 55 සේමු බළඇණි පුහුණු පාසල වෙත්තලකර්නි හි සාමුහික පුහුණුවීම් සිදු කරන ලදී.

55 සේනාංකාධිපති බ්‍රිගේඩියර් බිඑච්ජ්එම් විජේසිංහ පිඑස්සී විසින් ආරම්භක දේශණය පැවැත් වු අතර, පාඨමාලාව සඳහා නිලධාරින් 12 ක් හා සෙසුනිලයන් 251 දෙනෙකු සහභාගි වන ලදී. ඉතාමත් උද්යෝගිමත් ලෙස පාඨමාලාව හැදෑරු 14 ශ්‍රීලපාහ  අයවලුන් යුද උපක්‍රම, අභ්‍යන්තර ආරක්ෂක රාජකාරරි, ජීව වෙඩි තැබිම්, අවි පුහුණුව, සිතියම් කියවීම, ප්‍රතිවිප්ලවකාරි ක්‍රියාන්විත ආදිය ඉතාමත් කැපවීමෙන් යුතුව සිදු කරන ලද්දේ ඒකාකාරි රාජකාරි කටයුතු වලින් මිදී ලද අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගනිමිණි. බළඇණි පුහුණු පාසල මඟින් පවත්වන ලද ආරාධිත දේශණ යටතේ පාලන, භකාස, මනෝ විද්‍යාත්මක, බුද්ධි කටයුතු, මානසික ආතතිය, අන්තර් ජාතික මනුෂ්‍යවාදී නීතිය, පිළිබඳ එක්සත් ජාතින්ගේ සාමසාධක රාජකාරි පිළිබඳ දේශණ ඔවුනට මහත් පිටුවහලක් විය. ඒකක අණදෙන නිලධාරි විසින් පැවැත් වු දේශණය ද ඔවුන් හට මහත් පිටු වහලක් විය.

14 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි මේජර් ඩීසීකේඩබ්ලිව් රණසිංහ ආර්එස්පී ශ්‍රීලපාහ ලැබුණු නිවැරදි මඟ පෙන්වීමත් දිරිගැන්වීමත් බළඇණි පුහුණුවිම් සාර්ථකව ඉටු කර ගැනිමට හැක විය. සමස්ත බළඇණි පුහුණුවිම් අවසානයේ හොඳම



කණ්ඩායම 'ඩී' කණ්ඩායම ද, සැම අතින්ම අතිශූර ශිෂ්‍යා සහ දක්ෂම වෙඩික්කරු නි/7595 ලුතිනන් ආර්එම්පී උදය කුමාර  ශ්‍රිලපාහ ද, හොඳම ශාරිරික යෝග්‍යතාවයෙන් යුත් සෙබළා සෙ/14ඩී01619 සාසෙ රත්නායක ආර්එම් ද, දක්ෂම පෙළ අණදෙන්නා සෙ/14ඩී00193 කෝප්‍රල් රණසිංහ බණ්ඩා ඩබ්ලිව්එම් ද, දක්ෂම කණ්ඩ භාර නිලධාරි නි/31031 2/ලුතිනන් එම්කේඑස් මොරවක ශ්‍රීලපාහ ද දක්ෂතා දක්වමින් කුසලාන හිමිකර ගන්නා ලදී. ඉරිදා දිනයක දීම සියලු නිලයන් සදහා මල්ටි මීඩියා මඟින් විවිධ විනෝදාත්මක වැඩසටහන් පෙන්වා ඒකාකාරි සහ වෙහෙසකර මානුෂිකත්වයෙන් මිදි සියලු දෙනා හට විනෝදවීමට අවස්ථාව  ලබාදෙන ලදී.

අප බළඇණියේ දක්ෂතා අගය කිරිම සඳහා අවසන් දේශනයට පැමිණි 55 සේනාංකාධිපති තුමා විසින්  මහත් පැසසුමට ලක් කරමින් ජයග්‍රහණ කුසලතා ලබාදීමත් සමඟ ඉතාමත් සාර්ථක බළඇණි සාමුහික පුහුණුව නිමාවෙන් පසු ඒකකය වෙත සාමුහික නිවාඩුවක්ද ලබා දෙන ලදී.

**මූලස්ථානය 14 (සෙව්) ශ්‍රීලපාහ**





# 9(සෙව්) ශ්‍රීලපාහ වෙතින් මොණරවැව විහාරස්ථානයට ආවාසය ගෙයක්

මෙම ඒකක බළප්‍රදේශයේ වැලිඔය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් මොණරවැව ගම්මානයේ විහාරස්ථානය ත්‍රස්ත ග්‍රහණයට වසර 30කට ආසන්න කාලයක් හසුවී ඇතත් විහාරස්ථානයේ කිසිදු ස්වාමින් වහන්සේ නමක් වාසය නොකිරීමෙන් විනාශයට පත්වී ගරාවැටී නටඹුන් තත්ත්වයේ පැවතී ඇති.



621 බළසේනාධිපති තුමාගේ සහභාගිත්වයෙන් මෙම ඒකක අණදෙන නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ 2012.06.08 වන දින විහාරස්ථානයේ සංඝාවාසය හා බණ මඩුව ඉදිකිරීම සඳහා මුල්ගල තබන ලදී.

ඒ අනුව පුරා දින 54 ක් වෙහෙස මහන්සි වී ධානපතියන්ගේ සිමෙන්ති කිංග්‍රෑ: 50 මලු 40ක්, උලු පරිත්‍යාගයෙන් හා නි/සෙනින්ගේ පුද්ගලික ධන පරිත්‍යාගයෙන් අංග සම්පූර්ණ නාන කාමරයක් සහිතව සංඝාවාසය 2012.07.31 වන දින වන විට සදා නිම කරන ලදී.

2012.08.01 වන දින ඇසල පුර පසළොස්වක පෝහෝ දින ප්‍රදේශයේ සිවිල් ජනතාව හා මෙම ඒකක වෙතින් උත්සවයක් සහ පෙරහැරක් සංවිධානය කර බුදු පිළිම වහන්සේ, කරඬුව වැඩම කිරීම හා වස් වැසීම සඳහා ඇතාවැටුන ශ්‍රි උදුම්බරාරාමය විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය රණවන ධම්මින්ද හිමි වැඩම කරවා ඉදිකිරීම් අවසන්කර ඇති ආවාසය ගෙය සංඝ සතු කරන ලදී.

එම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 62 සේමු සේනාංකාධිපති බ්‍රිගේඩියර් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්පී, 621 බසේමු බළසේනාධිපති බ්‍රිගේඩියර් එච්පී සෙනෙවිරත්න හා මෙම ඒකක අණදෙන නිලධාරි මේජර් පීජ්එම්පී විජේගුණවර්ධන ශ්‍රීලපාහ ඇතුළු නිලධාරින්, සෙසුනිලයින් හා සිවිල් වැසියන් විශාල පිරිසක් සහභාගිවන ලදී.

**9 (සෙව්)ශ්‍රීලපාහ**








# 8 ශ්‍රීලපාහ වෙතින් සිදුකළ ප්‍රජා සත්කාරය

මෙම ඒකක බළඇණි මූලස්ථානය වෙත පිවිසෙන මාර්ග යේ දෙමළගම මංසන්දියේ පිහිටා ඇති අම්බලම ක්‍රි:ව: 1865 වර්ෂයේ ඉදි කරන ලද්දක් බැව් ඒ සැබැදිව තොරතුරු සොයා බැලීමේදී අනාවරණය වන ලදී. අතීතයේ මෙම ඉපැරණි අම්බලම වෙළඳ ව්‍යාපාර කටයුතු සඳහා පිටපළාත් වෙතින් පැමිණෙන ගැල් කරුවන් කොළඹ නගරය වෙත වෙළඳ භාණ්ඩ ප්‍රවාහනය කරන අතරතුරදී, ගමන් වීඩාව සංසිදවා ගැනීම සඳහා භාවිතාකර ඇත. ගැල්කරුවන් අතර බොහෝ ප්‍රසිද්ධ ස්ථානයක්ව පැවති බැවින් හා ඒ වකවානුවේදී බොහො දෙනෙකුට තාවකාලික නැවතුම් පොළක් වූ මෙම අම්බලම වර්තමානයේදී අබලන්ව ජරාවාසයට පත්ව මතට ඇබ්බැහිවූවන්ගේ තෝතැන්නක් බවට පත් වී තිබිණි. මෙවැනි ඓතිහාසික වටිනාකමක් ඇති ස්ථානයක් විනාශයට පත්වී යෑම යනු අපේ ඉතිහාසය විනාශ වීම හා සමාන බැවින් අනාගත පරම්පරාව වෙනුවෙන් ඒකක අණදෙන නිලධාරි මේ සබැදිව ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් දැනුවත් කිරීමෙන් පසු ඒකක හටපිරිස් වෙතද එහි ඇති ඓතිහාසික වටිනාකම පැහැදිලි කරදෙමින් ඒකකයේ දායකත්වය සහිතව අම්බලම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා උපදෙස් ලබාදී ඒ සඳහා ඇවැසි නිවැරදි මඟ පෙන්වා දෙන ලදී.





හටපිරිස් විසින් ජරාවසාව අබලන්ව තිබූ පෞරාණික අම්බලම ප්‍රතිසංස්කරණය කර මඟින්ගේ පිපාසය සංසිදවාලිම සඳහා පිංතාලියක් ද, ස්ථානගත කර මතට ඇබ්බැහි වුවන් එම ස්ථානයේ මත්ද්‍රව්‍ය පානය කිරීම වැලැක්වීම සඳහාත්, ඔවුන් හට නිවැරදි මාර්ගය අනාවරණය කරලීම සඳහාත්, බුදු පිළිමවහන්සේ නමක් වඩාහිදුවා පුද පූජා පැවත්වීමට සැලැස් විය. ඉන් පසුව මෙම ස්ථානයට අවශ්‍යව තිබූ දැන්වීම් පුවරුවක් ද ස්ථාපනය කර අම්බලම ගම් වැසියන් වෙත පරිහණය කිරීම සඳහා භාරදෙන ලදී.

බුද්ධි අංශය 8 ශ්‍රීලපාහ

# 613 වන බළසේනාධිපති තුමාගේ 26 ශ්‍රීලපාහ කඳවුරු සංචාරය

613 බළසේනාධිපති කර්නල් ජීඒඩී කහපොල ආර්එස්පී නව බළසේනාධිපති වශයෙන් රාජකාරි භාරගත් අතර, රාජකාරි ආරම්භයත් සමග 2012.07.07 දින කඳවුරු සංචාරයේ මුල් පියවර වශයෙන් 26 ශ්‍රීලපාහ ඒකකය වෙත පැමිණෙන ලදී.

මෙම ඒකකය වෙතින් බළසේනාධිපති වෙත සම්මාන මුරයක් පිරිනමා පිළිගන්නා ලදී. එම මොහොතේ ඒකකයේ හටපිරිස් පම්පෙමඩු සාමූහික බළඇණි පුහුණුවීම්වල නිරතව සිටි බැවින් සියලු දෙනා දිරිමත් කිරීම සඳහා පුහුණුවීමේ ඇති වැදගත්කම පිළිබඳව ද, සෙබළුන් වශයෙන් ඉදිරියේදී සමාජය තුළ සිවිල් ජනතාව සමග රාජකාරි ඉටු කිරීම පිළිබඳ මනා දැනුමක් හා අවබෝධයක් ලබාදීම සඳහා හරවත් දේශනයක් සිදු කරන ලදී. එහිදී සෙබළුන්ගේ රාජකාරි ගැටලු හා අඩුපාඩු ගැනද, පුහුණු පාසැලේ අඩුපාඩු හා අවශ්‍යතාවයන් ගැනද සොයා බලමින් පුහුණු පාසලේ කඳවුරු සංචාරය කරන ලදී.



බුද්ධි අංශය 26 ශ්‍රීලපාහ

# බලඇණි පුහුණුවීම් සාර්ථකව නිමකළ 26 ශ්‍රීලපාහ





ශ්‍රී ලංකා පාබල මැණියන්ගේ 26 වන බලඇණිය 613 බලසේනාව යටතේ පෙරියමඩු ප්‍රදේශයේ ස්ථානගතව සිවිල් වැසියන්ගේ ජන ජීවිතය යලි ගොඩනැගීමේ කටයුතුවල නිරතව සිටින අතර තුර බලඇණියේ සියලුම දෙනාගේ සාමුහිකත්වය ගොඩනැංවීම හා දැනුම වර්ධනය කිරීම සඳහා පුරා දින 43ක සාර්ථක බලඇණි පුහුණුවක් ලබා ගැනීමට ඒකකයේ සියලු දෙනාහට අවස්ථාවක් උදා විය. පුහුණුවීම් ආරම්භ කිරීමට පෙර ඒකකයේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ජේඑල්ටීකේ හේවා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ විසින් පුහුණුවීම් කටයුතු සම්බන්ධයෙන් සුපරික්ෂාකාරිව සොයා බලා පුහුණුවීම් සඳහා අවැසි සියලු කටයුතු සූදානම් කරන ලදී. සැලසුම් කළ පරිදි 61වන සේනාංකය යටතේ පාලනය වන පම්පෙමඩු පාබල බලඇණි පුහුණු පාසලේ දී 2012.06.22 දින පුහුණුවීම් කටයුතු ආරම්භ කළ අතර, ආරම්භක දේශනය 61වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඒ කාරියකරවන යූඑස්පී විසින් සිදු කරන ලදී. සේනාංකාධිපති විසින් සියලුම සෙබළුන් අමතා පුහුණුවේ ඇති වැදගත්කමත්, එය සිදු කළ යුත්තේ කුමන ආකාරයෙන්ද යන්නත්, පැහැදිලි කරන ලදී.



පුහුණුවීම් ආරම්භයේ සිටම ඒකකයේ අණදෙන නිලධාරි විසින් පවසා සිටියේ මෙම ලද මහගු අවස්ථාවෙන් උපරිම ප්‍රතිඵල ලබා ගත යුතු බවත්, සෙබළෙකුට දිය හැකි ඉහළම සුබසාධනය පුහුණුව බවත්, ඒ සඳහා සියලුම දෙනා උනන්දුවී කැපවීමෙන් කටයුතු සිදු කළ යුතු බවත්, එම කාල සීමාව තුළ විෂය මාලාව ඉතාමත් සාර්ථකව අධ්‍යනය කරමින් විනය ඉතා උසස් මට්ටමකින් පවත්වාගෙන යායුතු බවත්, දන්වා සිටින ලදී. පුහුණු කාලසටහනට අනුව ශාරීරික අභ්‍යාස, යුද උපක්‍රම, අභ්‍යන්තර ආරක්ෂක රාජකාරි, වන අභ්‍යාස, විවිධ දේශණ, ප්‍රායෝගික පුහුණුවීම්, කොම්පාසු සංචාර, බාධක තරණය, අවි පුහුණුව, වෙහෙසකර පා ගමන, සිතියම් කියවීම යන විෂයන්ට අමතරව පාඨමාලාවේ විශේෂ පුහුණුවක් ලෙස ජීව වෙඩි තැබීම් ද සිදු කළහ. බලඇණි ආධාරක අවි ජීව වෙඩි තැබීම් මාදුරුඔය ක්ෂේත්‍ර වෙඩිපිටියේදී සිදු කරන ලදී. මෙම බලඇණි පුහුණුවීම් සඳහා ඒකකයේ නිලධාරි 14ක් ද, සෙසුනිලයින් 367ක් ද, සහභාගි විය. පාඨමාලාවේ දක්ෂතම කණ්ඩායම ලෙස 'සී' කණ්ඩායම ද, පාඨමාලාවේ දක්ෂතම වෙඩික්කරු ලෙස සෙ/312482 කෝප්‍රල් සිරිවර්ධන එච්එම් හා දක්ෂතම පෙළ අණදෙන්නා ලෙස සෙ/315483 කෝප්‍රල් පුෂ්ප කුමාර කේටීඑන් ද සුදුසුකම් ලැබූහ. 2012.08.02 දින පාඨමාලාවේ නිමාව සනිටුහන් කිරීම වස් අවසන් දේශනය 613 බලසේනාධිපති කර්නල් පීජ්ඩී කහපොල ආර්එස්පී විසින් පැවැත් වූ අතර, එහිදී පාඨමාලාවේ දක්ෂතා දැක්වූවන් හට කුසලාන පිරිනමන ලදී.

පාඨමාලා කාලය තුළ කණ්ඩායම් මට්ටමින් හා බලඇණි මට්ටමින් විවිධ මාතෘකා යටතේ ඉදිරිපත් කිරීම් (Presentation) සිදු කරන ලදී. එම ඉදිරිපත් කිරීම් අතුරින් ''**මැදපෙරදිග අර්බුදය ශ්‍රී ලංකාවට බලපාන ආකාරය**'' නමින් ඉතා හරවත් දේශනයක් ඉදිරිපත් කිරීම ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ පැසසුමට ලක් විය. පාඨමාලා කාලය තුළදී ඒකක අණදෙන නිලධාරි විසින් සෙබළුන් දිරිමත් කිරීමට සතියේ සෑම සෙනසුරාදාවකම සංගීත කණ්ඩායමක් ගෙන්වා ඔවුන් ඒකාකාරිබවින් මුදවා ඔවුන් හට විනෝදාශ්වාදය සඳහා ඉඩ ප්‍රස්තාව ලබාදෙන ලදී. පාඨමාලාව අවසානයේ නිලධාරි නිවස්නයේ රාත්‍රී භෝජන සංග්‍රහයක් හා බනි/සැරයන් නිවස්නයේ සාදයක් ද, සියලුම නිලයින් සඳහා ප්‍රසිද්ධ ගායක ගායිකාවන්ගෙන් හා නර්ථනයන්ගෙන් සමන්විත අලංකාරවත් සංගීත සංදර්ශනයක් පවත්වන ලදී.

මෙම බලඇණි පුහුණුවීම් තුළින් නිලධාරින්ගේ හා සෙසුනිලයින්ගේ කුසලතා ඉතා උසස් තත්ත්වයකට ගෙන ඒමට හැකිවූ අතර, ඒකක අණදෙන නිලධාරි ගේ නායකත්වයත්, 611 බලසේනාධිපති බ්‍රිගේඩියර් කේජීඩී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී අයිජීගේ පූර්ණ අධීක්ෂණය හා 61 වන සේනාංකාධිපති ගේ මග පෙන්වීම හේතුවෙන් මෙම පන්නරය ලබාගැනීමට හැකිවීම අප බලඇණියට භාග්‍යකි. පුහුණුවීම් තුළින් ලබා ගන්නා ලද දැනුම ඒකකයට පැවරෙන රාජකාරි වඩාත් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ඉටු කිරීමට ඉමහත් අත්වැලක් වනු නොඅනුමානයි.

**බුද්ධි අංශය 26 ශ්‍රීලපාහ**



## සේවාවනිතා විත්ති







**2012.08.09**


ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ සම්බන්ධිකරණයෙන් හා රෙජිමූබ ශ්‍රීලපාහ ශ්‍රම දායකත්වයෙන් ශ්‍රී ලංකාවට හිතැති විදේශීය පුරවැසියන් පිරිසකගේ මූල්‍ය පරිත්‍යාග යෙන් ආබාධිත රණවිරුවෙක් වෙනුවෙන් හොරණ මිල්ලෑව රණවිරු ගම්මානයේ ඉදි කරන ලද නව නිවස රෙජිමේන්තු අධිපති තුමන්ගේ හා ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ සභාපතිනියගේ සුරතින් විවෘත කර සෙ/15056 කෝප්‍රල් කරුණාරත්න ඒඑම් රණවිරුවා වෙත පරිත්‍යාග කරන ලදී.



**2012.08.16**

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ක්‍රියාකාරි සාමාජිකාවක් වන ඉන්දිතා උපමාලි ගුණසේන මහත්මියගේ සම්බන්ධිකරණයෙන් ජර්මනියේ පදිංචි ශ්‍රී ලංකාවට ආදරය කරන හිතවතුන් පිරිසක් විසින් ආබාධිත රණවිරුවන් දෙදෙනෙකු වෙත කෘතිම පාද 02 ක් පරිත්‍යාග කිරීමේ උත්සවයක් රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී පැවැත් වූ අවස්ථාව.





**2012.08.23**

ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ මූල්‍ය දායකත්වයෙන් ආබාධිත රණවිරුවන් වෙත ඉදිකර දෙනු ලබන නිවාස වැඩසටහන යටතේ සෙ/325713 ලාකෝ විතානගේ ඩබ්ලිව්එස් යන රණවිරුවා වෙත නව නිවසක් ඉදිකර දීම සඳහා අනුරාධපුර නෙළුම්කුලම ප්‍රදේශයේදී රෙජිමූබ ශ්‍රීලපාහ අණදෙන නිලධාරි විසින් මුල්ගල තබන ලදී.







2012.08.27

ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාව මඟින් ලේ දන්දීමේ සමාජ සත්කාරක වැඩමුවක් රෙජිමේන්තු මධ්‍යස්ථාන දේශණ ශාලාවේදී දිනය පුරා රණවිරුවන් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් පැවැත් විය.





සේවා වනිතා විත්ති





2012 සැප්තැම්බර් මස 29 වන දින රෙජිමූඛ ශ්‍රීලපාහ ඒකකයට අයත් සැරයන් ජයතිලක වෙත ශ්‍රීලපාහ සේවා වනිතා සංගමය වෙතින් නිවසක් සදා ප්‍රදානය කරන ලදී එම අවස්ථාවට සහභාගී වූ රෙජිමේන්තු අධිපතිතුමා විසින් නව නිවස සැරයන් ජයතිලක හට භාරදීමට කටයුතු කරන ලදී.

# අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ අවසන් අධියර - 4 ශ්‍රීලපාහ

රට තුළ දශක තුනකට අධික කාලයක් පුරා පැවති කුරිරු ත්‍රස්තවාදය නිමාවෙන් අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ මහඟු කාර්යය යුද හමුදාව මැදිහත් වී සිදු කරන අතර, එහි අවසන් අධියර වශයෙන් මැණික්ෆාම් කඳවුරේ හා ආනන්ද කුමාරස්වාමි කඳවුරේ සිටි අවතැන් වූවන් 2012.09.21 වන දින වට්ටප්පලෙයි මහ විද්‍යාලය වෙත ගෙන්වා මූලික පහසුකම් සහිතව දින 05ක් වැනි කෙටි කාලයක් තුළ කෙප්පපිලව් ප්‍රදේශය නව ගම්මානයක් බවට පරිවර්ථනය කර ප්‍රථම අධියර වශයෙන් පවුල් 110ක් නැවත පදිංචි කරවීම මෙමඒකකය වෙතින් සාර්ථකව සිදු කරන ලදී. පසුව තවත් දින කිහිපයක් තුළ තවත් පවුල් 55ක් පදිංචි කරවන ලද අතර, පදිංචි කරවූ සම්පූර්ණ පවුල් සංඛ්‍යාව 165ක් විය.



මෙම ක්‍රියාදාමය ආසේමූ (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එල්බීආර් මාර්ක් ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ සංකල්පයක් අනුව 59 සේනාංකාධිපති බ්‍රිගේඩියර් ජීආර්එච් ඩයස් යූඑස්පී පීඑස්සී අයිජී ගේ පූර්ණ අධීක්ෂණය යටතේ 592 බළසේණාධිපති බ්‍රිගේඩියර් එස්ජ්ආර් සමරසිංහ ආර්එස්පී යූඑස්පී ගේ මග පෙන්වීම මත මෙම ඒකක අණදෙන නිලධාරි මේජර් ජීඩීජේසී ප්‍රේමතිලක පීඑස්සී ශ්‍රිලපාහ ප්‍රමුඛ 4 ශ්‍රිලපාහ ඒකක හටපිරිස්ගේ උපරිම දායකත්වයෙන් සිදු කළහ. එම අවතැන් වූ සිවිල් ජනතාව සඳහා වගා ලිං 03ක් පාවිච්චියට සුදුසු තත්ත්වයට සකස් කර දීම, තාවකාලික නිවාස 140ක් ද, නළ ලිං 10ක් ද, වැසිකිලි 35ක් ද, ජනතාවගේ මූලික අවශ්‍යතා වෙනුවෙන් සම්පූර්ණ කර දීමට අපට හැකි වන ලදී. මීට අමතරව ගම්මානය සඳහා ඇවැසි මාර්ග පද්ධතිය යුද හමුදාව විසින් සකස් කර දෙන ලදී.

මෙම නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම සඳහා විවිධ තරාතිරම් වල පුද්ගලයින් පැමිණි අතර,





ඔවුන් විසින් යුද හමුදාවේ කාර්යභාරය පැසසුම් කළහ. මෙම ක්‍රියාදාමය අසාර්ථක යයි ප්‍රකාශ කිරීමට හැකියාවක් නොලැබුණි. මෙය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ගත් කළ ඉතා වැදගත් කාර්යයක් වූ බැවින් අවසන් අධියරේ අවතැන්වූවන් නැවත පදිංචි කරවීමේ අවසන් ව්‍යපෘතිය අසාර්ථක බවට ජාතිකව හා ජාත්‍යන්තරව හඩක් නැගීමට උත්සහ කළ සමහර ජනමාධ්‍ය හා දෙමළ ඩයස් පෝරාවේ පුද්ගලයින් වෙත යුද හමුදාවේ මෙම කඩිනම් සත්කාරය නිසි පිළිතුරක් සපයනු ලැබීය. මෙහිදී මුලතිව් දිසාපති වෙලායුදන් මහතා විසින් අවශ්‍ය බඩු භාහිරාදිය රජය සම්බනධීකරණය කොට ලබා දුන් අතර, යුද හමුදාවේ හටපිරිස් විසින් දින 07ක් වැනි කෙටි කාලයක් තුළ පදිංචියට සුදුසු තාවකාලික නිවාස 140ක් තනා නිමකර භාර දෙන ලදී. මෙම නව සිවිල් ගම්මානය ස්ථාපිත කිරීමේදී අත්‍යාවශ්‍ය ආහාර බෙදා හැරීම්, වෛද්‍ය සායන, සිවිල් සම්බන්ධීකරණ කමිටු ඇරඹීම වැනි කාර්යයන් මෙම ඒකකයේ මූලිකත්වයෙන් ඉතා කඩිනමින් සිදු කරන ලදී.



ජාතික හා ජාත්‍යන්තරව ශ්‍රිලංකාවේ ප්‍රතිරූපයට හානි කිරීමට දැරූ උත්සහාය ව්‍යාර්ත කිරීමට දුන් සහයෝගය පිළිබඳව ආසේමූ (මුලතිව්) ආඥාපති, 59 සේනාංකාධිපති, 592 බළසේනාධිපති තුමන්ලා 4 ශ්‍රිලපාහ ඒකකය වෙත ඔවුන්ගේ ප්‍රශංසාත්මක ප්‍රණාමය පුද කරන ලදී. මෙම කටයුතු ඉටු කිරීමේදී 592 බසේමූ හා 12 ශ්‍රීලපාහ, 20 ගැහේබ ඒකක වෙතින් ලබා දුන් ශ්‍රම දායකත්වය මෙහිදී ස්තූති පූර්වකව සිහිපත් කළ යුතුය.

**බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ**

# ඩෙංගු වසංගතය මර්ධනයට 8 ශ්‍රීලපාහ දායකත්වය



අප උපන් දේශයේ ඇතිවන්නා වූ නොයෙකුත් ව්‍යසනයන් මැඩ පැවැත්වීම සඳහා නන් අයුරින් දායකත්වය ලබාදීමට යුද හමුදා සෙබළුන් ලෙස අප නිරන්තරයෙන් ඇපකැපවී සිටින්නෙමු. එවන් ව්‍යසනයන් අතුරින් තවත් එක් ව්‍යසනයක් ලෙස මාරාන්තික ඩෙංගු වසංගතය හැඳින්විය හැක. මෙම වසංගතය මැඩ පැවැත්වීම සඳහා නොයෙකුත් වැඩසටහන් වත්මන් රජය විසින් දියත් කළ අතර, එහිදී මුහුණ පෑමට සිදුවන නොයෙකුත් ගැටලු සහගත තත්ත්වයන් මගහරවා ගැනීම වස් යුද හමුදා සෙබළුන්ද යෙදවීම කාලෝචිත බැව් රජය විසින් තීරණය කිරීමෙන් පසු සක්‍රීයව ඒ මහගු කාර්යයට කොටස්කරුවෙකු වන්නට 8 ශ්‍රීලපාහ ඒකකයට හැකි විය.

8 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව කොළඹ ප්‍රදේශයේ හා ඒ අවට ප්‍රදේශයන්හි ස්ථානගතව රාජකාරි කරන බැවින් අවට ප්‍රදේශයන් තුළ ඩෙංගු මර්ධන කටයුතු




සඳහා ඒකකයේ හටපිරිස් හටද සෘජුව දායකත්වය ලබාදීමට හැකි විය. බළඇණි මූලස්ථානය හා අණ සහ පාලන කණ්ඩායම කොට්ඨාශ මූලස්ථානය 16හී හටපිරිස් සමඟ ඒකාබද්ධව මෙම උතුම් කාර්යය සිදු කරන ලදී. හටපිරිස් උනන්දු කරවීමට 142 බළසේනාධිපති තුමන් විසින් ලබාදුන් පන්නරය මේ මොහොතේත් සිහිපත් කිරීමට අප මැලි නොවෙමු. මෙහිදී මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හා කිරිඳිවැල, පූගොඩ, දොම්පෙ, බියගම, වැලිවේරිය, මල්වතු හිරිපිටිය සහ මීගහවත්ත යන පොලිස් ස්ථානයනයන්හි නියෝජිතයන්ද, ගම්පහ, දොම්පෙ, බියගම සහ මහර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින්ද නම්කරන ලද නියෝජිතයන් ද මෙම කාර්යයන්හි නිරත වූහ. ඩෙංගු වසන්ගතය මර්ධනය සඳහා මෙසේ ක්‍රියාකිරීම තුළින් ප්‍රදේශයේ ඩෙංගු වසංගතයේ කැපීපෙනෙන අඩුවීමක් දක්නට ලැබිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාදේශිය සභාවන්ට අයත් ප්‍රදේශයන් තුළ සිටින විද්වතුන්ගේ ප්‍රශංසාවට ද, ලක්වීමට අප හටපිරිස් හට හැකි වූ බැව් සඳහන් කරනුයේ නිහතමානි ආඩම්බරයෙණි.



අවවාදයට වඩා ආදර්ශය උතුම්ය යන්න පෙරදැරි කරගෙන ''සේවය කරමි'' උදෘතපාඨය සිත තුළ මුදුන්පත් කරගනිමින් කොමු 16 හී අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි කරනු ලබන අප බළඇණියේ අණදෙන නිලධාරිතුමාගේ නිවැරදි මඟපෙන්වීම යටතේ අප ස්ථානගතව සිටින කඳවුරු භූමිය පිරිසිදුව තබාගැනීමට දෛනිකව හා සතිපතා කඳවුර සම්පූර්ණයෙන්ම පිරිසිදු කිරීමටත්, කඳවුර අවට ප්‍රදේශයේ ඇති ගම්මානයන් හී වෙසෙන මහජනතාව වෙත ඩෙංගු වසංගතයෙහි ඇති භයානකකම හා ගෙවතු හා නිවෙස් පරිසිදු කිරීමෙන් ලබාගත හැකි යහපත් ප්‍රථිපල සැබඳිව ඔවුන් දැනුවත් කර ඩෙංගු මදුරුවන් බෝවන ස්ථානයන් පිරිසිදු කිරීමට කොමු 16 හටපිරිස් හා අප ඒකක හටපිරිස් එක්ව ක්‍රියා කරන බැව් මෙසේ සටහන් තබන්නෙමු.

මාරාන්තික ඩෙංගු මාරයාගෙන් මිනිස් ජීවිත බේරා ගැනිමේ මහගු කාර්යය වෙනුවෙන් කැපවෙන්නා වූ සියලුම දෙනාට මෙසේ ප්‍රනාමය පුදකර සිටින්නෙමු.

**බුද්ධි අංශය 8 ශ්‍රීලපාහ**

# 8 ශ්‍රීලපාහ මූලස්ථානයට නව බුද්ධ මන්දිරය

අඳුර දුරුවෙන - කළුට එන්නේ
දිනිදු රජයන - අග්නි දැහවල
දිනිදු සැඟවෙන - කළුට එන්නේ
සොම් සිසිල දෙන - සොඳුරු රෑමය
ගෙරවුමක හඬ - අකුණු එළියක
නොමැත වස්සානයේ - වැහි පොද
පවන ගෙන දෙයි - නොසිතූ මොහොතක
සිසිල කැටි කළ - මහා මේඝය
අප හද සැලෙනා - කළුට දිස්වෙයි
කළ ගුණක් නැති - මිනිස් රූපය
අප සිත් සැනසෙන - කළුට දිස්වෙයි
නිවුන රුව ඇති - බුද්ධ රූපය



එවන් වූ බුදු රුවකින් යුත් බුදු මැදුරක් අප කඳවුරට ඉතා අවශ්‍යව තිබූ කාල වකවානුවක් තුළදී කඳවුර වෙත වැඩම කළ කඳුබොඩ සියනෑ ජාත්‍යන්තර විපස්සනා භාවනා මධ්‍යස්ථානාධිකාරි පූජ්‍ය දියසෙන්පුර විමල හිමිපාණන් වහන්සේ උපදෙස් මත කඳවුරු භූමියේ නව බුදු මැදුරක් ඉදි කිරීම සඳහා ඒකක අණදෙන නිලධාරි කටයුතු සිදු කරන්නට විය.

අණදෙන නිලධාරි ඒකකයේ නිලධාරින් හා සෙබළුන් දැනුවත් කර කඩිනමින් නව බුදු මැදුරක් සැකසීමටත් බුදු පිළිමවහන්සේගේ රුවක් වැඩමවා තැන්පත් කිරීමට කටයුතු සිදු කරන ලදී. ඒ අනුව පූජ්‍ය දියසෙන්පුර විමල හිමියන්ගේ සම්බන්ධීකරණය යටතේ ශ්‍රී සංඝ බෝධි විහාරයේ පවත්වාගෙන යනු ලබන බෞද්ධයා මාධ්‍ය ජාලයේ ගරු සභාපති පරම පූජනීය ගෞරව ශාස්ත්‍රවේදී දරණාගම කුසල ධම්ම නායක ස්වාමීන්වහන්සේ විසින් 8 ශ්‍රීලපාහ ඒකකය වෙත බුදුරජානන් වහන්සේගේ පිළිමයක් පරිත්‍යාග කළ අතර, 2012.10.02 දින දියසෙන්පුර විමල හිමියන් සහ නව බුදු මැදුර ඉදි කිරීම සඳහා නන් අයුරින් උපකාර කිරීමට ඉදිරිපත් වූ දානපතියන් ද, ඒකකයේ සියලුම අයවලුන්ගේ සහභාගිත්වයෙන් යුතුව අලංකාර රන්විසි ගෙයකින් යුත් රථයක තැපත්කළ බුදු පිළිමය ශ්‍රී සංඝ බෝධි විහාරස්ථානයේ සිට දෙල්ගොඩ කඳවුර වෙත වැඩම කිරීමට සිදු කළහ. එම පෙරහරට කඳවුර වෙත පිවිසෙන මාර්ගයේ සිට කඳවුර තුළට රෙජිමේන්තුවේ හේවිසි කණ්ඩායමේ නාදය ද එක් කළහ.

මේ උතුම් පිංකම සඳහා අවට ගම්වාසීන් ද සහභාගීත්වය දක්වන ලදී. දැනට කඳවුරු භූමියේ ඒකකයේ සියුලුම අයවලුන්ගේ ශ්‍රමදායකත්වයෙන් නව බුදු මැදුර ඉදි වෙමින් පවතින අතර, ඒ සඳහා අවැසි මූල්‍යමය දායකත්වය යුනිකෝ ජලපොම්ප නිෂ්පාදන සමාගමේ සභාපතිනි නිදේශ ශක්ති දේශාභිමාණී දිරිය මතා මංජුලා විජේසිරි මැතිනිය සහ වෛද්‍ය හෙට්ටිආරච්චි මැතිනිය විසින් ලබාදෙනු ලබයි. අණදෙන නිලධාරි මේජර් එස්ජ්යූජ් සෝලංගආරච්චි පීඑස්සී ශ්‍රීලපාහ වෙතින් උපදෙස් හා දිරිගැන්වීම් නිරතුරුව ලබාදෙමින් මෙම බුදු මැදුරෙහි වැඩ කටයුතු නොබෝ දිනකින් අවසන් වීමට නියමිතව ඇත.

**බුද්ධි අංශය 8 ශ්‍රීලපාහ**





# 59 සේමු අභියෝගතා කුසලාන ක්‍රිකට් ශූරයෝ 4 ශ්‍රීලපාහ



59 සේනාංක මූලස්ථානය විසින් සංවිධානය කරන ලද සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය 59 සේනාංක මූලස්ථාන ක්‍රිඩාංගනයේදී පවත්වන ලදී. ඒ සඳහා සේමු/බසේමු සහ ඒකක වෙතින් ඉතාමත් දක්ෂ කණ්ඩායම් 11 සහභාගී වූ අතර, මෙම තරඟය අවසන් මහා තරඟය දක්වාම පිළිමළුන් පිටු දැකීමේ ක්‍රමයට තරඟ වැදුණි.

අර්ධ අවසාන වටය සඳහා 59 සේමු, 4 ශ්‍රීලපාහ සහ 5 (සෙව්) ශ්‍රීලංසිරෙ යන කණ්ඩායම් සුදුසුකම් ලැබූහ. අවසන් මහා තරඟය සඳහා කණ්ඩායම් දෙකක් තෝරා ගැනීම සඳහා ලොතරැයි ක්‍රමය උපයෝගී කර ගැනීමෙන් 59 සේමු කණ්ඩායම අවසන් මහ තරඟය සඳහා සුදුසුකම් ලැබූහ. ඉන් අනතුරුව අවසන් මහා තරඟය සඳහා ප්‍රතිවාදී කණ්ඩායම තීරණය වන්නේ 4 ශ්‍රීලපාහ සහ 5 (සෙව්) ශ්‍රීලංසිරෙ තරඟයෙන් ජයග්‍රහණ කරනා කණ්ඩායමයි. 4 ශ්‍රීලපාහ කණ්ඩායම ඉතා පහසු ජයග්‍රහණයක් ලබාගත්තේ 5 (සෙව්) ශ්‍රීලංසිරෙ කණ්ඩායම තරඟාවලියේ අඩුම ලකුණු සංඛ්‍යාවකට සීමා කරමිණි.

ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) ආඥාපති බ්‍රිගේඩියර් සීඑම්ජී චන්ද්‍රසේකර ආර්එස්පී යූඑස්පී, 59 සේනාංකාධිපති බ්‍රිගේඩියර් ජීආර්එච් ඩයස් යූඑස්පී පීඑස්සී අයිජී ඇතුලු සේමු යටතේ ඇති බළසේනාධිපතිවරුන් ඒකක අණදෙන නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් සහභාගී වූ අවසාන මහා තරඟය 59 සේනාංක මූලස්ථාන ක්‍රීඩාංගනයේදී 2012.08.10 දින පැවැත් විය. එම තරඟයේදී 4 ශ්‍රීලපාහ කණ්ඩායම 84 ක් ලබා ගත් අතර, 59 සේනාංක මූලස්ථාන කණ්ඩායම ලකුණු 58 කට සීමා කර 59 සේනාංක ක්‍රිකට් කිරුළ 4 ශ්‍රීලපාහ ඒකකය හිමි කර ගන්නා ලදී. ඒකක හටපිරිස්ගේ දිරිගැන්වීමට අමතරව 12 ශ්‍රීලපාහ හා 23 ශ්‍රීලපාහ ඒකක හටපිරිස් හී දිරි ගැන්වීමද හිමි විය.

4 ශ්‍රීලපාහ කණ්ඩායමේ නායක නි/68020 ලුතිතන් එන්ඩීපී වික්‍රමසිංහ ශ්‍රීලපාහ තරඟාවලියේ වීරයා ලෙසද අවසාන මහා තරඟයේ වීරයා ලෙස සෙ/327408 ලාකෝ ධර්මදාස ආර්එස්ඩී යන අයවලුන් සම්මාන ලැබූහ.

මෙම ජයග්‍රහණය ලබාගැනීම සඳහා 4 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරිගේ දැඩි කැපවීම ඉමහත් හේතුවක් වූ අතර, කණ්ඩායම තුළ සිටි ක්‍රීඩකයින්ගේ දක්ෂතාවය හා කැපවීමත් සහ ඒකකයේ අනෙකුත් අයවලුන්ගේ දිරි ගැන්වීම සහ අශිර්වාදය මෙම ජයග්‍රහණය ලබා ගැනීම සඳහා ඉමහත් පිටුවහලක් විය. අවසාන මහා තරඟයේදී 12 සහ 23 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරි වරුන් ඇතුලු සියලුම දෙනා ලබා දුන් සහයෝගය ඉතාමත් කෘතඥතා පූර්වකව මින් සිහිකර සිටින්නෙමු.

බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ

## දෙන්න දන් කුළුණු සිතින්

උදයට පායන හිරු සවසට බැස යනවා
කාලය සෙමෙන් මේ ලෙස ගෙවිලා යනවා
බාධක කම්කටළු මැද ජීවිතය ගත වෙනවා
ටික ටික අපි මරුවා හට ලං වෙනවා

මේ ලොව සියලු දේ අස්ථිර බැව් වටහා ගන්න
යන කොට ගෙනි යන්නේ කළ හොඳ පමණි පිළිගන්න
ඒ ගැන සිතා දන්වත් පිං සිදු කර ගන්න
අප සැම මැරෙන බව පමනක් සිහියට අර ගන්න

දුන්නොත් යමක් අන් අයෙකුට කුළුනු සිතින්
ඔබටත් ලැබෙයි ඒ වගේ දස දහස් ගනන්
දෙනවානම් දෙන්න දන් පිරුණු සිතින්
සිතින් අල්ලාගෙන දීමෙන් පලක් නෑ නේද අතින්

## පැල්පතක වෙසෙන දුප්පත් ගෙවිලියක්

වහලේ සිදුරු අතරින් වැහි බිඳු බේරේ
ගොම මැටි නොගෑ බිම පොඩි වලවල් හෑරේ
කටුමැටි බිත්තියේ පොළවට බර තේරේ
මැටි ගැලවිලා දියකඳ යයි ගෙය පාරේ

නිල මැසි රොදින් යටවුණු කැත කුණු කසල
කෝදුරු කරල් ඇත එල්ලුණ ගෙහි වහල
මේ ගෙට තිබෙන කමතක් වැනි පොඩි මිදුල
තණකොල උඩින් මතුවුණු තුත්තිරි අකුල

දූලි කුණු වැකුණු ඇයගේ වැරහැළි රෙද්ද
ලිපකට දමුවාට අයියෝ ගිනි ඇවිලෙයිද
සැප යනු ඇයට මොන තරමේ බොරුවක්ද
ඇගේ දුක අපායකවත් ඇත්තට ඇද්ද

සෙ/311084 ලාකෝ උදය කුමාර ආර්ඩබ්ලිව් 25 ශ්‍රීලපාහ

# ශ්‍රීලපාහ පුහුණු පාසලට නව බුද්ධ මන්දිරයක්

1989 වර්ෂයේ රෙජිමේන්තු පුහුණු අංශය ලෙස රෙම ශ්‍රීලපාහ හීදි පිහිටුවන ලද මෙම පුහුණු අංශය යුද්ධ හමුදාවේ ව්‍යාප්තියත් සමඟ 2000 නොවැම්බර් මස 06 දින රෙජිමේන්තු පුහුණු පාසල ශ්‍රීලපාහ වශයෙන් බූස්ස කඳවුරේදී ස්ථාපිත කරන ලදී.

මෙම පුහුණු පාසල දිවයිනේ පිහිටි යුද හමුදා පුහුණු පාසල් අතුරින් ප්‍රධාන ආධුනික පුහුණු පාසලක් ලෙස හැඳින්විය හැක. රෙජිමේන්තු අධිපති තුමන්ගේ හා රෙජිමේන්තු සේනාවිධායක තුමන්ගේ මග පෙන්වීම මත නව බුද්ධ මන්දිරයක් ප්‍රධාන උපදේශක මේජර් ඒඑම්එම් ගුණසේකර ශ්‍රීලපාහ ගේ අධීක්ෂණය යටතේ පුහුණු පාසල් භූමියේ ඉදි කරගෙන යනු ලබයි.

මෙම බුද්ධ මන්දිරය පුහුණු පාසලේ සියලුම නිලධාරි, සෙසුනිලයින්, ආධුනික සෙනීන්ගේ සහ ප්‍රදේශයේ පරිත්‍යාග ශීලින්ගේ උදව් උපකාර මත ගොඩ නඟන අතර, එහි පිළිම වහන්සේ නම නොබෝදා ප්‍රධාන උපදේශක තුමන්ගේ ප්‍රධානත්වයෙන් තැන්පත් කරන ලදී.





# ආබාධිත රණවිරුවකු හට විරුවෙකුගෙන් පරිත්‍යාගයක්



දශක 03ක් පුරාවට ශ්‍රීලංකාද්වීපය භීතියට පත් කළ කුරිරු යුද්ධය නිමා කිරීමට පාබල විරුවන්ගේ දායකත්වය අතිමහත්ය. එහිදී පාබල විරුවන් දහස් ගණනක් සිය ජීවිත කැප කළ අතර, තවත් විරුවන් සිය අත්පා මව්බිම වෙනුවෙන් පූජා කළහ.


මෙවන් සෙබළුන් අතුරින් ජයසිකුරු ක්‍රියාන්විතයේදී ත්‍රස්තවාදීන්ගේ මෝටාර් ප්‍රහාරයකට ලක්ව දකුණු පාදයේ දණහිසට ඉහළින් ඉවත් කරන ලද 6 ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/303569 ලාකෝ ප්‍රේමලාල් එන්එච් රණවිරුවා හට ශ්‍රී ලංකා පාබල හමුදා පුහුණු පාසලෙහි ප්‍රධාන උපදේශක වශයෙන් රාජකාරි කරනු ලබන මේජර් ඒඑම්එම් ගුණසේකර ශ්‍රීලපාහ විසින් අත්වාරු යුවලක් 2012.07.17 දින පාබල හමුදා පුහුණු පාසල් පරිශ්‍රයේදී පරිත්‍යාග කරන ලදී.

මූලස්ථානය
රෙජිමේන්තු පුහුණු පාසල ශ්‍රීලපාහ බූස්ස

# ලෝක ජූඩෝ දිනය

'සැමට ජූඩෝ ' යන තේමාව යටතේ ලෝක ජූඩෝ දිනය දෙවන වරට ඔක්තෝබර් 28 දින සමරයි. 2011 දී ප්‍රථම වරට ජාත්‍යන්තර ජූඩෝ සංගමය විසින් ලෝක ජූඩෝ දිනය ප්‍රකාශයට පත් කළ අතර, එම වර්ෂයේදී ප්‍රථම වරට රටවල් 51ක් පමණ මෙම දිනය සැමරීමට විවිධ තරඟ, පුහුණුවීම් සහ තවත් විශේෂ අවස්ථා සංවිධානය කොට තිබිණි. මෙම වසරේදී ඊටත් වඩා විශාල පිරිසක් ලෝක ජූඩෝ දිනය සමරනු ඇත.

'මෘදු ක්‍රමය' යන අරුත ඇති ජූඩෝ ක්‍රීඩාවේ නිර්මාතෘවරයා ජපන් ජාතික මහාචාර්ය ජිගොරෝ කානෝ (1860 - 1938) ය. ඒ මහතා ඉපදුනේ අද වගේ දවසකයි. මිකාගේ නැමති සමුද්‍රට ආසන්න නගරයක උපන් ජිගොරෝ කානෝ කුඩා කළ සිය මවගේ අභාවයට පසුව 1871දී ටෝකියෝවල පදිංචි වී තිබේ.




ෂිගා ප්‍රදේශයේ ෂින්ටෝ හියොෂි ආශ්‍රමයේ ප්‍රධාන පූජකතුමාගේ හදාවඩා ගත් පුතෙකු වූ ජිරෝසකු, ජිගොරෝ කානෝගේ පියා විය. මව වූයේ සකේ නිෂ්පාදන සමාගමක අයිතිකරුගේ දියණියක වූ සඩාකෝ කානෝ ය. විවිධ ආයතන ඔස්සේ උසස් අධ්‍යාපනයකට ද උරුමකම් කියූ ජිගොරෝ කානෝ සටන් කලාවක් ලෙස ආරම්භයේ සිටම ජුජුට්සු හදාරා තිබිණි. 1868 දී ජපානයේ තොකුගාවා හමුදා පාලනය අවසන් වෙමින් පැවති අතර, මෙයිජි පාලනය පසුව ස්ථාපිත විය. මෙකළ ජුජුට්සු ක්‍රීඩාව අභාවයට යමින් තිබිණි. ජපානය ද ශීඝ්‍රයෙන් බටහිරකරණය වෙමින් තිබිණි. සටන් කලාවට දැඩි ඇල්මක් දැක් වූ ජිගොරෝ කානෝ කෙටි කාලයෙන් විවිධ ජුජුට්සු ගුරුවරු වෙත යමින් සිටි අතර, 1877දී ටෝකියෝ - කයිසෙයි පාසලේදී (පසුව මෙම පාසල විශ්ව විද්‍යාලයක් බවට පත් විය) ෆුකුඩා හචිනෝ සුකේ (1848 - 1880) වෙතින් ජුජුට්සු හැදෑරුවේය. 1880දී ෆුකුඩා මියගිය අතර, පසුව ඉසෝ මසමුටෝ (1820 - 1881) යටතේ ජුජුට්සු හැදෑරුවේය. ජූඩෝ ඉතිහාසය පවසන පරිදි ජිගොරෝ කානෝ ටෙන්ජින් ෂින්යෝ රියු සහ කිටෝ රියු යන ජුජුට්සු ශෛලින් ගැඹුරින් හදාරා තිබිණි.

1882දී ජුජුට්සු ක්‍රීඩාව ආශ්‍රය කොටගෙන ජිගොරෝ කානෝ විසින් කොඩොකාන් ජූඩෝ ලොවට හදුන්වා දෙන ලදී. ජපානයේ ශාරීරික අධ්‍යාපනයේ හා ක්‍රීඩාවේ පියා වශයෙන් ද සැලකෙන හෙතෙම ටෝකියෝ උසස් අධ්‍යාපන ආයතනයේ විදුහල්පතිවරයාව සිටි සමයේ ප්‍රධාන ශාරීරික අභ්‍යාස අධ්‍යාපන පීඨය ආරම්භ කළේය. ජපන් ආධුනික ක්‍රීඩා සංගමය පිහිටුවීමෙහිලා ද පුරෝගාමියෙක් වූ මහාචාර්ය ජිගොරෝ කානෝ 1909 දී ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවේ සාමාජිකත්වය දැරූ ප්‍රථම ජපන් ජාතිකයා මෙන්ම ආසියාතිකයා බවට පත් විය. ටෝකියෝ විශ්ව විද්‍යාලයෙන් දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව හා සාහිත්‍යය පිළිබඳව ද හසල දැනුමක් ලබා තිබූ හෙතෙම ජූඩෝ ක්‍රීඩාව ලොව පුරා ව්‍යාප්ත කිරීමෙහිලා දේශණ හා ජූඩෝ සංදර්ශණ සඳහා 13 වාරයක් විදේශ ගත වීඇති බව ජූඩෝ පුහුණු මුලස්ථානය වන ජපානයේ ටෝකියෝ වල කොඩෝකාන් ජූඩෝ ආයතනයේ වෙබ් අඩවියක සඳහන් වේ.

1964 දී ඔලිම්පික් ක්‍රීඩාවක් ලෙස ජූඩෝ පිළිගත් අතර පිරිමි තරඟ වලට පමණක් සීමා විය. 1992 දී ප්‍රථම වරට ඔලිම්පික් කාන්තා තරඟ සඳහා ද පිළිගැනිම ලැබිණි. එසේම තවත් විශේෂයෙන් සඳහන් කළ යුත්තේ ඔලිම්පික් ක්‍රීඩාවක් බවට පත් වූ පළමුවන ජපන් සටන් කලාව ද ජූඩෝ බවයි. අද ලොව පුරා මිලියන 40 කට අධික පිරිසක් ජූඩෝ ක්‍රීඩාවේ නියැළෙති. අද ස්විට්සර්ලන්තයේ ලොසෑන් වල තිබෙන ජාත්‍යන්තර ජූඩෝ සංගමය 1951 ජුලි මාසයේදී පිහිටුවනු ලැබිණි. ඉතාලි ජාතික ඇල්ඩෝ ටෝඩ් මහතා එහි ප්‍රථම සභාපතිවරයා වූ අතර, වත්මන් සභාපතිවරයා වන්නේ ඔස්ට්‍රියා ජාතික මරිස් විසාර් මහතාය. ශ්‍රී ලංකාවේ ජූඩෝ සම්බන්ධව ද කෙටියෙන් යමක් සඳහන් කරන්නේ නම් 1911 දී ලංකාවට පැමිණි මහාචාර්ය සියෝ ඔස්ලි කොළඹ තරුණ ක්‍රිස්තියානි සංගමයේදී ජූඩෝ පිළිබඳව හදුන්වා දී තිබේ. 1953දී මුලින්ම ලංකා ආධුනික ජූඩෝ සංගමය පිහිටුවන ලදී. එහි ප්‍රථම සභාපතිවරයා වූයේ ටීබී දැරණියගල මහතා ය. ලංකාවේ ප්‍රථම ආධුනික ජූඩෝ තරඟාවලිය 1960දී පැවැත්වුනු අතර, එය පැවැත්වීම පහසු වූයේ 1956දී මහාචාර්ය හසෝවෝ මිසිකා මහතාගේ මුලිකත්වයෙන් ජූඩෝ ක්‍රීඩාවට අවශ්‍ය මෙට්ට සහ ඇඳුම් ලංකාවට මුලින්ම ලැබුනු හෙයිනි. කෙසේ හෝ වර්තමානය වන විට ත්‍රිවිධ හමුදාව ඇතුලුව ක්‍රීඩා සමාජ 60කට ආසන්න ප්‍රමාණයක් වටා ජූඩෝ ක්‍රීඩාව ව්‍යාප්ත වෙමින් පවතියි.

මෙම ලිපියට තවත් විශේෂ යමක් එක් කිරීම සුදුසු යැයි හැඟේ. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ජූඩෝ ගීතයක් ගායනා වූයේ 2011 වසරේදීය. 1952දී ජපන් ජාතික කියුසෝ මිෆුනේ (කළුපටි 10 වන ශ්‍රේණිය ) විසින් ලියා තිබූ ඉංග්‍රිසි ජූඩෝ ගීතය ලොව ප්‍රථම වරට ගායනා වූයේ 2011 සැප්තැම්බර් 20වන දින සවස පනාගොඩ යුද හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසලේදී පැවැති යුද හමුදා අන්තර් රෙජිමේන්තු ජූඩෝ තරඟාවලියේ අවසන් දින උත්සවයේ දීය. යුද හමුදා පෙරදිග තූර්ය වාදක කණ්ඩායමේ කපිතාන් සේනාධීර ජයරත්න ගේ තනුවට අනුව එම සංගිත කණ්ඩායම විසින් එම ඉංග්‍රිසි ජූඩෝ ගීතය ගායනා කරන ලදී. ඊට පසුව 2012 සැප්තැම්බර් 20වන දින එම ස්ථානයේම පැවැති යුද හමුදා අන්තර් රෙජිමේන්තු ජූඩෝ තරඟාවලියේ සමාප්ති දින උත්සවයේදී යුද හමුදා ජූඩෝ කමිටුවේ මේජර් තරිඳු වීරසිංහ විසින් සිංහල භාෂාවට පරිවර්තනය කළ එම ගීතය එම සංගීත කණ්ඩායම විසින්ම ගායනා කරන ලදී. ඒ අනුව සංගීත ක්ෂේත්‍රයට ද තවත් අලුත් අත්දැකීමක් එක් කරමින් ලොව ප්‍රථම වරට සිංහල බසින් ජූඩෝ ගීතයක් ගායනා වූයේ එදිනය. එදිනම ජූඩෝ ගැන ලියවුනු ඉංග්‍රිසි කවි දෙකක් ඇසුරු කොට ගෙන මේජර් තරිඳු වීරසිංහ විසින් රචනා කරන ලද නව ඉංග්‍රිසි ජූඩෝ ගීත දෙකක් ද ප්‍රථම වරට යුද හමුදා පෙරදිග තූර්ය වාදක කණ්ඩායම ගායනා කළේ කපිතාන් සේනාධීර ජයරත්න ගේ තනු නිර්මාණ වලට අනුවයි.

ජූඩෝ ක්‍රීඩාව දිවයින පුරා ප්‍රචලිත කිරීමෙහිලා තවත් කටයුත්තකට යුද හමුදා ජූඩෝ කමිටුවේ බ්‍රිගේඩියර් රේනක උඩවත්ත, ලුතිතන් කර්නල් නලින් ජයතිලක, ලුතිතන් කර්නල් මේනක ප්‍රනාන්දු, මේජර් තරිඳු වීරසිංහ හා ප්‍රධාන පුහුණුකරු බළලත් නිලධාරි ක්‍රිශාන්ත ඇතුලු යුද හමුදා ජූඩෝ පුහුණු සංචිතය දැන් මුලපුරා තිබේ. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ලෝක ජූඩෝ දිනය සැමරීමට යුද හමුදාව යම් පියවරක් ගැනීම එම කටයුත්තයි.

**මේජර් තරිඳු වීරසිංහ ශ්‍රීලපාහ**
**ලේකම් ශ්‍රීලපාහ ජූඩෝ කමිටුව**

# රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී

මාතෘභූමිය වෙනුවෙන් එඩිතර රණවිරුවන් රැසක් බිහිකළ විශිෂ්ට රෙජිමේන්තුව ශ්‍රී ලංකා පාබල හමුදාවයි. වර්ෂ 1881.04.01 වන දින පාබල හමුදාවේ ආරම්භය සනිටුහන් කර ඇත. එතැන් පටන් එහි අභිමානවත් ගමන් මගේදී ශ්‍රී ලංකා යුද හමුදාවේ අනිකුත් රෙජිමේන්තු බිහි කරමින් දෙවන ලෝක සංග්‍රාමයන්ට මෙන්ම පැමිණි ත්‍රස්තවාදී උවදුරු තුරන් කිරීමට මනා දායකත්වය දී ඇත අභිමානවත් ලෙස 132 වන සංවත්සරයට සමගාමීව උත්සව මාලාවක් පනාගොඩ පාබල හමුදා කඳවුරේදී පවත්වන්නට යෙදුණි.

පාබල හමුදාවේ රෙජිමේන්තු මධ්‍යස්ථානය ස්ථාපනය කර 2012.10.23 වන දිනට වසර 23ක් සපිරීම නිමිත්තෙන් 2012.10.19 වන දින සිට 24 දක්වා සමරනු ලැබුවේ ආගමික වතාවත් වලට මුල්තැන දෙමිණි. එහිදී මියගිය හා අතුරුදහන් වූ රණවිරුවන් ඉතා අභිමානයෙන් යුතුව සිහිපත් කර අබාධිත තත්ත්වයේ පසුවන විරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කළහ. ශ්‍රී යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි සහ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් හා රෙජිමේන්තු සේනාවිධායක කර්නල් කේජේ ජයවීර ආර්එස්පී ගේ මගපෙන්වීම යටතේ 2012 ඔක්තෝබර් මස 19 වන දින සධාතුක කරඬුව පෙරටුකරගත් අලංකාර පෙරහරකින් මහා සංඝරත්නය වඩමවා රාත්‍රිය පහන්වන තුරු පිරිත් සජ්ඣායනාවක් පවත්වා පසු දින මහා සංඝරත්නය වෙනුවෙන් සාංඝික හීල දානය පිරි නමා රෙජිමේන්තුව වෙනුවෙන් ප්‍රාන දානයෙන් දිවි දුන් රණවිරු හට පිංපෙත් පැමිණීම













# ලුපාහ 132 වන සංවත්සරය

මෙන්ම කාය දානයෙන් තම ශරීරාංග පූජා කරමින් තවමත් රෝහල් ගතව ප්‍රතිකාර ලබන විරුවන්ට ඉක්මන් සුවය හා රෙජිමේන්තු වර්ණ ධජයන්ට, ඒකක ධජයන්ට, කණ්ඩුල හස්තියාට, සියලුම අයවලුන්ට සෙත් ප්‍රාර්ථනා කළහ.

රෙජිමේන්තු ඉතිහාසයේ ප්‍රථම වතාවට රෙජිමේන්තු සරඹ භූමියේ විදුලි ආලෝකයෙන් ආලෝකමත් කර රාත්‍රී සරඹ පෙළපාළියක් රෙජිමේන්තු අධිපතිතුමන් හට පාබල හමුදාවේ සියලුම ඒකකයන්ගේ අණදෙන නිලධාරිවරුන් ඇතුලුව නිලධාරි 76 දෙනෙක් සහ ඒකක














# රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ 132 වන සංවත්සරය

රෙජිමේන්තු සැරයන් මේජර්වරු ඇතුලුව සෙසුනිලයින් 576 දෙනෙකුගේ සහභාගීත්වයෙන් අභිමානවත් අයුරින් වර්ණ ධජ, මංගල හස්තියා සහිත පෙළපාළියක් පිළිගන්වන ලද්දෙ අභිමානයෙන් යුතුවයි.

එම පෙළපාළියෙන් පසු රෙජිමේන්තුවේ නිත්‍ය ඒකක 15ක් හා ස්වේච්ඡා ඒකක 08ක් අතුරින් 'ප්‍ර', 'පා', 'භාකස', 'ගිණුම' කටයුතු හා 'ක්‍රීඩා හා පොදු කටයුතු යන විෂයන් හය අතුරින් තම කටයුතු නිසි අයුරින් ඉටු කිරීමෙන් හා උසස් මූලස්ථානයන් හි නිරීක්‍ෂනයන්ට ලක් නොවී ඒකකයන් හි අභිවෘද්ධිය වෙනුවෙන් කැපවූ ඒකකයන් වෙත කුසලාන හිමි ගැන්වීම සිදු කරන ලදී.

රෙජිමේන්තු මධ්‍යස්ථානය තුළ හා එයට අනුබද්ද ඒකකයන්හි සරඹ කුසලතාවයන් රෙජිමේන්තුවට ආවේනික වූ සිරිත් පවත්වාගැනිමේ අන්තර් ඒකක සරඹ තරගාවලියේ පෙරට පැමිණ - **ශූරතාවය - 11 ශ්‍රීලපාහ** හා **අනුශූරතාවය - 1 ශ්‍රීලපාහ** හිමිකර ගන්නා ලදී.

සෑම ඒකකයන්හිම පාලන රාජකාරින්හි මුල් පුරුක ලෙස හා සෙසුනිලයන්ගේ හැගීම් හා ඔවුන්ට ආවේනික වූ ගැටළු ඒකක අණදෙන නිලධාරින් දැනුවත් කිරීම තුළින් හා තම අත්දැකීම් තුළින් සුදුසු පරිදි තම අභිමතයන් ලබාදෙමින් ඒකක අභිවෘද්ධිය කෙරෙහි කළා වූ සේවය අගයමින් නිත්‍ය හා ස්වේච්ඡා ඒකක අතුරින් දක්ෂතම ඒකක විනයශාලා භාර ලිපිකරු ලෙසින් - **බනි 11 ජයමාන්න එම්පී - 1 ශ්‍රීලපාහ** කුසලානය හිමිකර ගන්නා ලදී.

ඒකකයෙහි සෙසුනිලයන්ගේ ජ්‍යෙෂ්ඨතමයා වෙමින් තම අණ වචනයෙන්, පැවැත්මෙන් හා හික්මීමෙන් අන් අයට ආදර්ශයක් වෙමින් හා ඒකක අණදෙන නිලධාරිගේ අභිමතයන් අපේක්ෂාවන් හා රෙජිමේන්තුවට ආවේනික වූ පැවැත්මන් තම ඒකකය තුළ පවත්වාගෙන යමින් නිලධාරින් හා සෙසුනිලයන් අතර, මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම මතින් තම ඒකකයේ පැවැත්ම උදෙසා සිදු කළා වූ අමිල මෙහෙය උදෙසා 2012 වසරේ හොඳම රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් **- බනි 1 ඩීඒඩීපී ගුණවර්ධන - 23 ශ්‍රීලපාහ** කුසලානය හිමිකර ගන්නා ලදී.

ඒකක පරාසය තුළ තමා වෙත පැවරෙන්නා වූ මාණ්ඩලික රාජකාරීන් හා ඒකකයට ආවේනික වූ පැවැත්මන් ආරක්‍ෂා කරමින්, ඒකකය තුළ හා ඉන් පිටත මනා විනයක් පවත්වා ගැනීම සඳහා ඒකක නිලධාරින් හා සෙසුනිලයන් සම්බන්ධීකරණය කිරීම, නිසි උපදෙස් නිසි කාලයන් තුළදී අදාල ස්ථාන වෙත ලබාදීම තුළින් ඒකකයේ සාර්ථකත්වය හා ගෞරවය ආරක්‍ෂා කර ගැනීම සඳහා සිදු කළා වූ මෙහෙය අගයමින් 2012 වසරේ දක්‍ෂතම විධායක අධිකාර ලෙස **- කපිතාන් එම්සී ප්‍රසාද් ශ්‍රීලපාහ - 2(සේවි) ශ්‍රීලපාහ** විසින් හිමිකර ගන්නා ලදී

පෙර අතීතයේ සිට පාබල විරුවන් ක්‍රීඩා කටයුතු සඳහා තම දක්‍ෂතා පෙන්වා ඇත. ඔවුන් ගිය මග යමින් ශ්‍රී ලංකා පාබල හමුදාව ලක් ක්‍රීඩා අඹරේ තරුවක් කිරීම සඳහා එදා අවිය අත දැරූ රණවිරුවන් ක්‍රීඩා භූමිය වෙත යොමු කරමින්, සෑම ක්‍රීඩාවක් සඳහාම දායකත්වය ලබාදෙමින්, ක්‍රීඩා ඉසව් සඳහා ලක් මැණියන් නියෝජනයෙන්ද, ආරක්‍ෂක ක්‍රීඩා උළෙල, යුද හමුදා ක්‍රීඩා උළෙල, රෙජිමේන්තු ක්‍රීඩා උළෙල නියෝජනය කරමින්, ඒකක ගෞරවය රැක ගනිමින් ශූරතාවයන් ලබාගත් ක්‍රීඩා තරු බිහි කිරීමෙන් පාබල හමුදා රෙජිමේන්තුවේ ක්‍රීඩා කටයුතු පිළිබඳ අති දක්‍ෂ ඒකකය ලෙස ශූරතාවය ලැබුවේ **- 1 ශ්‍රීලපාහ** ඒකකය හිමිකර ගන්නා ලදී.

සුදුසු පරිදි හටනිවාස පවත්වාගෙන යාම හා නිසි හිමිකම් ඒකක නිලයන් වෙත නිසි කලට ලබාදෙමින්, සුදුසු පරීක්‍ෂණ මණ්ඩල පවත්වාගෙන යාම හා ඒ මණ්ඩල උසස් මූලස්ථාන වෙත යොමු කිරීමෙන්ද, ඒකකය වෙත වෙන් කරන්නා වූ ප්‍රතිපාදන නිසි පරිදි යෙදවීම හා ඒවා ප්‍රතිපූර්ණය කිරීම සඳහා ක්‍රියා කිරීම තුළින් ඒකක අභිවෘද්ධිය උදෙසා හා හටපිරිස් හි උන්නතිය සඳහා කටයුතු කිරීම වෙනුවෙන් හටකාර්ය සම්පාදන කරුණු සඳහා පිරිනමනු ලබන කුසලානය **- 8 ශ්‍රීලපාහ** ඒකකය හිමිකරගන්නා ලදී.

ඒකකය තුළ වූ සියලු නිලයින්ගේ පුද්ගලික තොරතුරු පවත්වා ගනිමින් ඔවුන් වෙත හිමිවිය යුතු නිසි දීමනා හා උසස් කිරීම් ලබාදෙමින් සියලු නිලයන් තෘප්තිමත් කිරීම හා නිනොනො වීම් අවම මට්ටමක පවත්වා ගනිමින් නිසිකළ මූලික පරීක්‍ෂණ උසාවි පවත්වා ගනිමින් හා මූල්‍ය කටයුතු, ගිණුම් කටයුතු මනාව පවත්වා ගැනිම හා ඒකක කාර්යාල පවත්වාගෙන යාම වෙනුවෙන් හොඳම පාලන කටයුතු පිළිබඳව කුසලානය **- 20 ශ්‍රීලපාහ** හිමිකර ගන්නා ලදී.

තම බළඇණියේ සියලු නිලයින්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා සුදුසු පාඨමාලාවන් සඳහා යොමු කිරීමෙන්ද, හැඳුණුම්පත් නිසිකලට ලබාදීමෙන්ද අවි ආයුධ ගැටළු නිසි පරිදි සමතයට පත් කිරීමෙන් හා සුදුසු ආරක්‍ෂාව ඒ සඳහා ලබාදීම තුළින්, ක්‍රමවත් ක්‍රමවේද පවත්වා ගැනීම හා තම හටපිරිස් ඉහළ මූලස්ථාන වෙතින් ලැබෙන්නා වූ ක්‍රියාන්විත උපදෙස් සඳහා නිසි පරිදි යොමු කරමින් සිදු කළා වූ මෙහෙය අගය කරමින් 'ප්‍ර' කරුණු සඳහා කුසලානය **- 7 ශ්‍රීලපාහ** ඒකකය හිමිකර ගන්නා ලදී.


අභිමානවත් වූ වසර 132ක ඉතිහාසයකට හිමිකම් කියන්නා වූ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ නිත්‍ය හා ස්වේච්ඡා බළඇණි 24ක් අතුරින් තම බළඇණිය සෑම අතින්ම අති සාර්ථක බළඇණියක් බවට පත් කිරීම සඳහා තම දායකත්වය ලබාදෙමින් හා ඔවුනට නායකත්වය ලබාදෙමින් සිදුකළ මෙහෙය හා උසස් මූලස්ථාන හා සම්බන්ධව තම බළඇණිය වෙත පැවරෙන්නා වූ රාජකාරි මනා ලෙස ඉටු කිරීම තුළින් නායකත්වයේ ප්‍රතිමූර්තියක් හා අවංකභාවයේ කැඩපතක් වෙමින් තම බළඇණියට ලබාදුන්නා වූ නායකත්වය තුළින් ඒකකය තුළ සිදු කළා වූ විශිෂ්ට මෙහෙය උදෙසා දක්‍ෂතම ඒකක අණදෙන නිලධාරි ලෙස කුසලානය 20 ශ්‍රීලපාහ හිටපු අණදෙන නිලධාරි ලෙසින් **- කර්නල් පීජේපී ගමගේ** යන ජ්‍යෙෂ්ඨ නිලධාරි හිමිකර ගන්නා ලදී.

සෑම අතින් අතිශූර ස්වේච්ඡා ඒකක ලෙසින් අභිසේක ලැබුවේ - **ප්‍රථම ස්ථානය - 2 (සේවි) ශ්‍රීලපාහ, දෙවන ස්ථානය - 17 (සේවි) ශ්‍රීලපාහ, තෙවන ස්ථානය - 9 (සේවි) ශ්‍රීලපාහ** ඒකක ද, අතිශූර නිත්‍ය බළඇණි ලෙසින් - **ප්‍රථම ස්ථානය - 1 ශ්‍රීලපාහ, දෙවන ස්ථානය - 20 ශ්‍රීලපාහ, තෙවන ස්ථානය - 12 ශ්‍රීලපාහ** ඒකක කුසලාන හිමි කර ගන්නා ලදී.

කුසලාන හිමි ගැන්වීමෙන් පසු රෙජිමේන්තු තූර්ය වාදක කණ්ඩායමේ නර්තනයන් වලින පසු මල් වෙඩි සංදර්ශනයකින් පසු රෙජිමේන්තු සංවත්සර කටයුතු නිමාවන ලදී. මෙම සංවත්සර දිනය නැරඹීම සඳහා යුද හමුදාවේ සෑම රෙජිමේන්තුවන් හී ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විශ්‍රාම ලැබ සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරින් හා සෙසුනිලයින් විශාල පිරිසක් එක් වූහ. වසර එකසිය තිස් දෙකක් ශ්‍රී ලංකා යුද හමුදාව වෙනුවෙන් අමිල මෙහෙයක් ලක් මැණියන් වෙනුවෙන් ඉටුකර ඇති අතර, තව තව ඉටුකිරීමට හැකිවී යුද හමුදාවේ හොඳම රෙජිමේන්තුව වශයෙන් අභිෂේක ලබන්නට හැකිවේවායි ප්‍රාර්ථනය කරන්නෙමු.

වයිට් හැකල් ප්‍රකාශන අංශය රෙම ශ්‍රීලපාහ

# තෙවන සංවත්සරය 24 ශ්‍රීලපාහ



දශක තුනකට ආසන්න කාලයක් අපගේ මව්බිම වෙලාගෙන සිටි රුදුරු ත්‍රස්තවාදය පරදවා සාමයේ අරුනලු පිබිදෙන මෙවන් මොහොතක 24වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ තෙවන සංවත්සර දිනය ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් ඒකක ධජයට සෙත්පතා උත්සවශ්‍රීයෙන් සැමරීමට ලැබීම මහත්වූ භාග්‍යයකි. 2012.09.24 වන දින අනුරාධපුර අශෝක ළමා නිවාසයේ දෙමව්පියන්ගේ සෙනෙහස අහිමි අසරණ වූ දරුවන් වෙනුවෙන් දිවා ආහාර වේලක් පිළිගැන්වීම අණදෙන නිලධාරිගේ සුරතින් සිදු කළ අතර, ඉන් පසු දරුවන් වෙත සුවඳ විලවුන් හා තෑගි ප්‍රදානය කිරීමේදී දෑත් දිගුකොට එම දරුවන් ඒවා ලබා ගත්තේ ආත්ම ගණනකදි පියෙක් නොදුටුවා සේ පුංචි සිත්වල සිනහව ද කැටිකොට සතුටු කඳුළු මුතුකැට සේ කඩා හලමිණි. යුද බිමේ දිවිපුදා හා අතුරුදන් වූ රණවිරුවන් හට පිං පැමිණ වීමටත් ආබාධිත රණවිරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමටත්



රාජකාරියේ නියුතු සියලුම නිලධාරින් හා සෙසුනිලයින් හටත් ඔවුන්ගේ පවුල්වල සාමාජික/සාමාජිකාවන්ටත් සිවිල් සේවක මහතුන්ටත් සෙත්පතා එදින පස්වරුවේ ඓතිහාසික අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස බෝධිපූජා පිංකමක් පවත්වන ලදී. 2012.09.25 දින ඒකකයේ අභිමානය විදහා දක්වමින් ඒකක දිනය නිමිතිකොට ගෙන සම්ප්‍රදායානුකූලව අණදෙන නිලධාරි වෙත සම්මාන මුරයක් හා සම්මාන පෙළපාළියක් පිරිනමා ගෞරව දැක්වීමට ඒකකයේ නිලධාරින් ඇතුලුව සෙසුනිලයින් කටයුතු කළහ. අනතුරුව අණදෙන නිලධාරි විසින් හටපිරිස් අමතා විනය ගරුකව සහ ධෛර්යමත්ව අවංකව තම කාර්යයන් ඉටු කරන ලෙසත් රටේ ඉදිරි සංවර්ධන ක්‍රියාවලිය සඳහා කැපවෙමින් තම දායකත්වය ලබාදී ඒකක බලප්‍රදේශයේ



ජීවත්වන සියලුම ජනතාවගේ සිත් සතන් දිනාගෙන නැවත විනාශකාරි යුද්ධයක් ඇති නොවන ලෙස වගකීමකින් යුතුව තම රාජකාරි ඉටුකරන ලෙස වැඩිදුරටත් පැවසීය. තෙවන බළඇණි දිනය සංකේතවත් කරමින් රුක් රෝපනය කිරීමෙන් පසු උසස්වීම් ලද ජ්‍යෙකොනොනින් හට නිල ලාංඡන පළඳවන ලදී. පසුව සියලු නිලයින් එක්ව දිවා භෝජන සංග්‍රහයට සහභාගි විය. 2012.09.26 වන දින සංවත්සරයට සමගාමිව ක්‍රීඩා තරඟ ජයග්‍රහනය වෙනුවෙන් ජය සංකේත ලබාදීම ද සිදු කළහ. ඒකකයේ රාජකාරි නියුතු සියලුම නිලයින් හා සිවිල් සේවක මහතුන් ගේ එකමුතුකම හා සුහද සිලිත්වය ගොඩ නැංවීම සදහා ප්‍රසිද්ධ නර්තන කණ්ඩායම් දෙකක සාමාජිකාවන්ගෙන් එදින රාත්‍රියේ වේදිකාව හැඩ ගන්වා යුද හමුදා සේවා බලකායේ අධිරිද්ම සංගීත කණ්ඩායමේ දායකත්වයෙන් දිවයිනේ ජනප්‍රිය ගායික ගායිකාවන් රැසකගේ මියුරු නදින් සංගීත ප්‍රසංගයක් පවත්වන ලදී. වසර තුනක් වැනි කෙටි කාලයක් තුළ ඒකකයේ



සියලුම නිලධාරින් සෙසුනිලයින්ගේ හා ප්‍රදේශයේ සිවිල් ජනතාවගේ සුහදත්වය වර්ධනය කිරීම හා ඔවුන්ගේ සුබසාධක කටයුතු පිළිබඳව ඉටුකළ මෙහෙවර ආසේමු(වන්නි) ආඥාපති තුමාගේ හා 21 සේනාංකාධිපති තුමා, 213 බලසේනාධිපති තුමාගේ ගෞරවයට පාත්‍රවිය. මෙම ඒකකය ස්ථාපනය කර වසර තුනක් සපිරෙන මේ මොහොතේ නොයෙකුත් දුෂ්කරතා මාධ්‍යයේ මෙම බළඇණිය යුද හමුදාවේ දීප්තිමත් බළඇණියක් ලෙස පෙරමුණට ගෙන ඒමට හැකිවුයේ අණදෙන නිලධාරිගේ නිවැරදි මග පෙන්වීම හා ඒකකයේ සියලුම නිලයින්ගේ කැපවීමෙන් බැව් මේ සුවිශේෂ අවස්ථාවේ සනිටුහන් කරනුයේ ඉතාමත් ආඩම්බරයෙනි.

**බුද්ධි අංශය 24 ශ්‍රීලපාහ**

# 23 ශ්‍රීලපාහ නව අණදෙන නිලධාරි



නි/62421 මේජර් එස් විජේසිරිවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ

වර්ෂ 2009.07.23 වන දින රෙම ශ්‍රීලපාහ හීදී නගා සිටවනු ලැබූ 23වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවෙහි පළමු අණදෙන නිලධාරි වශයෙන් ලුතිතන් කර්නල් ටීසීකේ පීරිස් ආර්එස්පී ශ්‍රීලපාහ පත් වූ අතර, තම රාජකාරි කාලසීමාව අවසානයේ 2012.08.02 වන දින එම තනතුරේ රාජකාරි මේජර් එස් විජේසිරිවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ වෙත භාරදෙන ලදී. එදින කඳවුරු පිවිසුම අභියසදී ඒකක දෙවන අණදෙන නිලධාරි මේජර් එස්එල් නන්දසේන ශ්‍රීලපාහ විසින් නව අණදෙන නිලධාරි ඒකකය වෙත පිළිගැනීමෙන් පසු කඳවුරු සම්මාන මුරය පිළිගන්වන ලදී.

අනතුරුව චිරාගත සම්ප්‍රදායානුකූලව නව අණදෙන නිලධාරි විසින් පොල්තෙල් පහන දැල්වීමෙන් පසු මුලතිව් සිරි සමුද්‍රගිරි රජ මහා විහාරවාසි කිලිනොච්චි සාගර හිමියන් විසින් රැස්ව සිටි ඒකක මූලස්ථාන කාර්ය මණ්ඩලය පංච ශීලයෙහි පිහිටවීම සිදු කෙරුණි. අනතුරුව සියලු ආශීර්වාද මධ්‍යයේ සුබ මොහොතින් මේජර් එස් විජේසිරිවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ 23 ශ්‍රීලපාහ ඒකකයේ නව අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි භාර ගන්නා ලදී.

මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ වසර 19 ක යුද්ධ හමුදා සේවා කාලය තුළ යුද බිමෙහි දක්වන ලද විශිෂ්ට දස්කම් හේතුවෙන් රණශූර පදක්කමෙන් පිදුම් ලබා ඇති අතර, එම කාලසීමාව තුළදී ලද අත්දැකීම් සහ පරිනතභාවය හා හදාරන ලද දේශීය/විදේශීය පාඨමාලාවලින් ලත් දැනුම තුළින් මෙම බළඇණිය ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ සහ යුද්ධ හමුදාවේ දිදුලන බළඇණියක් වනු ඇතැයි ඒකකයේ සියලුම දෙනා විශ්වාසය කරන්නෙමු. නව නියමුවානණෙනි, ඔබගේ සැලසුම් සියල්ල සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා! එමෙන්ම ඒකකයේ නිලධාරි හා සෙසුනිල සියලු දෙනා ඔබ තුමන් හට ඇවැසි සහයෝගය ලබාදීම සඳහා නිරන්තරයෙන්ම කැප වී සිටින්නෙමු.

**වයිට් හැකල් අංශය 23 ශ්‍රීලපාහ**

# දමිළ වැසියෙකුට පිළිසරණක්



කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කෝනාවිල් ප්‍රදේශයේ ස්ථානගත 7 ශ්‍රීලපාහ සී කණ්ඩායම් බළ ප්‍රදේශයට අයත් කෝනාවිල් පදිංචි ජෝන් කෙනඩි මහතා හට අයත් නිවහන හදිසියේ ඇතිවූ ගින්නෙන් විනාශයට පත්වන ලදී. මෙම ප්‍රදේශයේ බහුතරයක් දමිළ වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය වනුයේ කෘෂිකාර්මික කටයුතු වන අතර, ජෝන් කෙනඩි මහතා හට සිදුවූ හදිසි ආපදාව හේතුවෙන් එම පවුලේ අය ඉතාම අසරණ තත්ත්වයකට පත්විය. ඒකක අණදෙන නිලධාරිගේ උපදෙස් මත 7 ශ්‍රීලපාහ 'සී' කණ්ඩායමේ නිලධාරි අණදෙන සහ හටපිරිස් හී ශ්‍රම දායකත්වයෙන් අසරණ වූ එම ගොවි මහතා හට ඉතා කඩිනමින් තාවකාලික නව නිවසක් ඉදිකර දීමට කටයුතු කරන ලදී. එමෙන්ම කණ්ඩායම් නිලධාරි අණදෙන සහ සෙනීන් විසින් විපතට පත් ජෝන් කෙනඩි මහතා හට මුදල් පරිත්‍යාගයක්ද සිදු කරන ලදී.



**බුද්ධි අංශය 7 ශ්‍රීලපාහ**

# අන්තර් රෙජිමේන්තු ආධුනික ජුඩෝ තරඟාවලියේ අනුශූරතාවය ශ්‍රීලපාහට හිමි වෙයි

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීයු පීඑස්සී ගේ සංකල්පයකට අනුව 2010 වර්ෂයේ ජූඩෝ ක්‍රීඩාව වැඩි දියුණුකර නිසි ප්‍රථිපල ලබා ගැනිම සඳහා 26 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් ජේඑල්ටීකේ හේවා ආර්ඩබ්ලිව් ආර්එස්පී ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපතිතුමා විසින් පත් කරන ලදී.

ඒ අනුව 26 ශ්‍රීලපාහ අණදෙන නිලධාරිගේ අධීක්ෂණය යටතේ සෙනින් තෝරා ගැනීමේදී මෙම ඒකකය වෙතින් සෙනින් දස දෙනෙකු ද ඇතුලුව අනිකුත් සියලුම ශ්‍රීලපාහ ඒකකයන් වෙතින් ද සෙනින් තෝරා ගැනීමෙන් අනතුරුව පුහුණුවීම් කටයුතු අනුරාධපුර ප්‍රදේශයේ සිදු කළ අතර, 2011 වර්ෂයේ ශ්‍රීලපාහ රෙජිමේන්තු අන්තර් ඒකක තරඟාවලිය සඳහා වැඩිදුර පුහුණුවක් ලබාගැනිමට ශ්‍රී ලංකා ජුඩෝ සංගම් මුලස්ථානය - කොළඹ වෙත ද රපෝර්තු කරවන ලදී. එම නිවැරදි පුහුණුව තුළින් 2011 වර්ෂයේ පැවති දිස්ත්‍රික්, පලාත්, සමස්ත ලංකා මට්ටමින් පැවති ජුඩෝ තරඟ සඳහා සහභාගි වීමට අප රෙජිමේන්තු කණ්ඩායමට හැකි විය. තවද, 2011 වර්ෂයේ පැවති සමස්ත යුද හමුදා අන්තර් රෙජිමේන්තු තරඟාවලියේ හතරවන ස්ථානයට පත් වෙමින් ශ්‍රීලපාහ රෙජිමේන්තුවට මහත් කීර්තියක් මෙන්ම ගෞරවයක් අත්කර දෙන ලදී.

2012 වර්ෂයේ සමස්ත ලංකා ජුඩෝ තරඟාවලිය සඳහා ශ්‍රී ලංකා යුද හමුදා ජුඩෝ සංචිතය නියෝජනය කරමින් ශ්‍රීලපාහ රෙජිමේන්තු ක්‍රීඩකයන්ද එක් වී ශ්‍රී ලංකා ආධුනික ජුඩෝ තරඟාවලියේ ශූරතාවය දිනා ගැනිමට දායක වු අතර, අප රෙජිමේන්තු ක්‍රීඩකයන් හටද එම තරඟාවලියෙන් රන් රිදී සහ ලෝකඩ පදක්කම් දිනා ගනිමින් සමස්ත යුද හමුදාවට රෙජිමේන්තුවට කීර්තියක් අත්කර දුනි.


එමෙන්ම 2012 වර්ෂයේ ජුඩෝ ක්‍රීඩාව සඳහා දිස්ත්‍රික්, පළාත් මට්ටමින් ජයග්‍රහණය කොට ඒ සඳහා ක්‍රීඩා කිරීමට අප රෙජිමේන්තු ක්‍රීඩකයන් දස දෙනෙක් සුදුසුකම් ලැබීම ශ්‍රීලපාහ රෙජිමේන්තුවට මහත් ගෞරවයක් විය.

2012 වර්ෂයේ පැවති යුද හමුදා අන්තර් රෙජිමේන්තු ආධුනික ජුඩෝ තරඟාවලියේ බර පංති 05ක් යටතේ පමණක් තරඟ කර රෙජිමේන්තු 19ක් අභිබවා ශ්‍රීලපාහ ජුඩෝ කණ්ඩායම සමස්ත ජුඩෝ තරඟාවලියේ අනුශූරයන් බවට පත් වුයේ ශ්‍රීලපාහ රෙජිමේන්තුවට මහත් අභිමානයක් අත්කර දෙමිණි.

| | | | | |
|---|---|---|---|---|
| **කි:ග්‍රෑ: 50 බර පන්තිය** | | | | |
| සෙ/326828 | සාසෙ | වනිගසේකර | ඩබ්එම්පීඑම් | - 1 ශ්‍රීලපාහ රිදී පදක්කම |
| **කි:ග්‍රෑ: 60 බර පන්තිය** | | | | |
| සෙ/329101 | සාසෙ | ජයසිරි | ආර්පීඅයි | - 26 ශ්‍රීලපාහ රිදී පදක්කම |
| **කි:ග්‍රෑ: 66 බර පන්තිය** | | | | |
| සෙ/329591 | සාසෙ | චන්දිමාල් | ජේඑස්එම්යූ | - 11 ශ්‍රීලපාහ රන් පදක්කම |
| සෙ/329303 | සාසෙ | අබේරත්න | ඒආර් | - 1 ශ්‍රීලපාහ රිදී පදක්කම |
| **කි:ග්‍රෑ: 73 බර පන්තිය** | | | | |
| සෙ/327761 | සාසෙ | කුමාරසිරි | ටීඩීපී | - 20 ශ්‍රීලපාහ රිදී පදක්කම |
| සෙ/329130 | සාසෙ | වීරසිංහ | ඩබ්ලිව්එස් | - 26 ශ්‍රීලපාහ ලෝකඩ පදක්කම |
| **කණ්ඩායම් තරඟය** | | | | |
| ශ්‍රීලපාහ රෙජිමේන්තු කණ්ඩායම | | | | ලෝකඩ පදක්කම |
| සමස්ත තරඟාවලියේ ශ්‍රීලපාහ රෙජිමේන්තු කණ්ඩායම | | | | අනුශූරතාවය |

මේ සඳහා හුදෙක්ම ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති තුමන් සහ ශ්‍රීලපාහ ජුඩෝ සංචිතය භාර ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මග පෙන්වීම අධික්ෂණය සහ ඔවුන්ට ලබා දුන් නිවැරදි පුහුණුව තුළින් ලබාගත් ජයග්‍රහණයක් බැව් සඳහන් කළ හැක. එමෙන්ම ශ්‍රීලපාහ ජුඩෝ සංචිතය ලද අත්දැකීම් උපයෝගි කර ගනිමින් ඉදිරියේදී පැවැත්වෙන තරඟාවලි වලින් තව තවත් ඉදිරියට පැමිණීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

**බුද්ධි අංශය 26 ශ්‍රීලපාහ**



# පම්පෙමඩු පුහුණු පාසැලට 26 ශ්‍රීලපාහ වෙතින් ජ්‍යෙෂ්ඨ නිලධාරි විවේකාගාරයක්



611 වන බළසේනාව යටතේ පාලනය වන පම්පෙමඩු පාබල බළඇණි පුහුණු පාසලේ 26 ශ්‍රීලපාහ බළඇණි පුහුණුවීම් සිදු කළ අතර, ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ජේඑල්ටීකේ හේවා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ හට පුහුණු පාසලේ ජ්‍යෙෂ්ඨ නිලධාරි විවේකාගාරයක් නොමැති බැව් දැනගැනීමට ලැබී ඇත. පසුව අණදෙන නිලධාරිගේ අදහසකට අනුව පුහුණු පාසල වෙත ජ්‍යෙෂ්ඨ නිලධාරි විවේකාගාරයක් 26 ශ්‍රීලපාහ දායකත්වයෙන් මාසයක් වැනි කෙටි කාලයක් තුළ ඉතා අලංකාරවත් හා ඉහළ ප්‍රමිතියකින් යුතුව කඩිනමින් ගොඩනඟා 61 සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඒ කාරියකරවන යූඑස්පී ගේ සුරතින් 2012 අගෝස්තු මස 02 වන දින විවෘත කෙරිණි.

ඉතා කෙටි කාලයක් තුළ මෙහි ඉදිකිරීම් නිම කිරීමට හැකිවීම මඟින් ඒකකයේ එකමුතුභාවයත්, ශක්තිමත් භාවයත්, හැකියාවත්, මනාව පිළිබිඹු කරවන බව එය විවෘත කිරීමට පැමිණි සේනාංකාධිපතිතුමා ප්‍රකාශ කර 26 ශ්‍රීලපාහ ඒකකයට ප්‍රශංසා කරන ලදී.

බුද්ධි අංශය 26 ශ්‍රීලපාහ



## සමාජ සේවයට කැපවූ පාබල විරුවෙක්



ශ්‍රී ලංකා පාබල හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් වන මේජර් ඒඑම්එම් ගුණසේකර ශ්‍රීලපාහ ශ්‍රී ලංකා පාබල හමුදාවට අභිමානයක් ගෙන දෙමින් දකුණු ලකේ ඉටු කර ඇති සේවාවන් වෙනුවෙන් **සමාජසේවා කීර්ති දේශබන්දු ලංකා පුත්‍ර, ශාසන සේවා කීර්ති ශ්‍රී දේශමාන්‍ය** යන ගෞරව නාමයෙන් පිදුම් ලබාගෙන ඇත. මෙතුමා මුළු දිවයිනටම බලපාන පරිදි සාම විනිසුරුවරයෙකි.

ප්‍රදේශයේ ප්‍රකට සමාජ සේවකයෙකු වන මෙතුමාගේ සමාජ සේවාවන් තවත් වර්ධනය කරලමින් සිනිගම සිංහ සමාජයේ අධ්‍යක්ෂක ධුරයෙන්ද නොබොදා පිදුම් ලැබීය.

මෙවැනි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු අප ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ සිටීම රෙජිමේන්තුවේ අභිමානයට මෙන්ම මුලු මහත් යුද්ධ හමුදාවටම ලද දායදයකි. මෙතුමන් හට ඔහුගේ ඉදිරි වැඩ කටයුතු සර්ව ප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි අප ප්‍රාර්ථනා කර සිටිමු.

මූලස්ථානය
රෙජිමේන්තු පුහුණු පාසල ශ්‍රීලපාහ බූස්ස

# 16 එජාසාසාබ අණදෙන නිලධාරී

**''සාමය රැකීම සොල්දාදුවකුගේ රාජකාරියක් නොවුවත් එය කළ හැක්කේ ද සොල්දාදුවකුටම පමණක්ය''.** යන තේමාව සත්‍යක් බවට පත් කරමින් හයිටි දේශය තුළ සාම සාධක රාජකාරින්හි නිරත වෙමින් විශාල කීර්තියක් ශ්‍රී ලංකාව වෙත අත්කර දීමට මේ දක්වා හයිටි දේශයේ සාම සාධක රාජකාරි සිදු කරන ලද සියලුම බළඇණි සමත් වී ඇත. 2004 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා පාබල හමුදා බළඇණි 04ක් (16 වන බළඇණිය ඇතුලුව) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ බළඇණි 03ක්, ගැමුණු හේවා රෙජිමේන්තුවේ බළඇණි 03ක්, ගජබා රෙජිමේන්තුවේ බළඇණි 03ක්, විජයබා රෙජිමේන්තුවේ බළඇණි 03ක් වශයෙන් බළඇණි 16ක් මිනුස්ථා (MINUSTHA–UNITED NATIONS STABILIZATION MISSION IN HITI) සමග එක්ව රාජකාරි සිදුකර ඇත.



මෙතෙක් එම බළඇණි ආ ගමන් මග තව තවත් සාර්ථක කිරීම වස් 16 වන එක්සත් ජාතින්ගේ සාම සාධක බළඇණිය ලෙස ශ්‍රී ලංකා පාබල හමුදාව ප්‍රමුඛ අනෙකුත් ආධාරක හා සේවා රෙජිමේන්තු වලට අයත් 650 දෙනෙකුගෙන් සමන්විත හටපිරිසක් 2012 අගෝස්තු මස 04 දින ගුවන් මගින් හයිටි දේශය වෙත පා තබන ලදී.



හයිටි දේහය තුළ අප බළඇණි පවත්වාගෙන ආ සම්ප්‍රදායික සිරිත් විරිත් වලට ගරු කරමින් 2012 සැප්තැම්බර් මස 10 වන දින හයිටි දේශයෙන් පිටත්ව යාමට නියමිත 15 වන එක්සත් ජාතින්ගේ සාම සාධක බළඇණියේ අණදෙන නිලධාරි හට 16 වන බළඇණියේ නිලධාරි හා සෙසුනිලයන් වෙතින් ගෞරවාන්විත සම්මාන පෙළපාළියක් පිරිනමන ලදී. එහිදි පිළිවෙළින් එක්සත් ජාතින්ගේ ධජය, ශ්‍රී ලංකා ජාතික ධජය, හයිටි ජාතික ධජය, හා ත්‍රිවිධ හමුදා ධජයන් 15 වන බළඇණියේ අණදෙන නිලධාරි විසින් 16 වන බළඇණයේ අණදෙන නිලධාරි වෙත භාරදෙන ලදී. ඉන් අනතුරුව නික්ම යන අණදෙන නිලධාරි විසින් තම රාජකාරින් නව අණදෙන නිලධාරි කර්නල් එම්එම් කිත්සිරි ආර්එස්පී හට භාර දෙන ලදී.

පසුදින එනම් 2012 සැප්තැම්බර් මස 11 දින 0816 පැයට යෙදුනු සුබ මොහොතින් නව අණදෙන නිලධාරි අබිනවයෙන් නව තනතුරේ රාජකාරි භාර ගැනිමට යෙදුනි. එහිදි නව අණදෙන නිලධාරි කදවුර වෙත ප්‍රථමයෙන්ම පිළිගනු ලැබුවේ ගෞරවාන්විත සම්මාන මුරයකිනි. ඉන් අනතුරුව ආගමික වතාවත් වලට හා සම්ප්‍රදායික වත් පිළිවෙත් වලට මුත් තැන දෙමින් පොල් තෙල් පහන දල්වා කිරි උතුරවා බළඇණියේ සියලුම නිලධාරින් සහ සෙසුනිලයින්ගේ ආශිර්වාදය මධ්‍යයේ 16 වන සාම සාධක බළඇණියේ අණදෙන නිලධාරි ලෙස නිල වශයෙන් රාජකාරි භාර ගන්නා ලදී. එම මොහොත හයිටි දේශය තළ සදා මතකයේ තැබුමට අණදෙන නිලධාරි විසින් ලියෝගන් කඳවුරු භූමිය තුළ අඹ පැළයක්ද රෝපණය කරන ලදී.



මෙසේ අභිනවයෙන් නව තනතුරකට පත් 16වන සාම සාධක බළඇණිය නව අණදෙන නිලධාරි කර්නල් එම්එම් කිත්සිරි ආර්එස්පී තුමන් හට තම සාම සාධක රාජකාරින් මෙන්ම සියලුම යුද හමුදා රාජකාරින් සර්වප්‍රකාරයෙන් සාර්ථක කරගැනීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය හා සියලු දෙවියන්ගේ ආශිර්වාදය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.



මූලස්ථානය
16 එජාසාසාබ

# සුබ මොහොතින් නව තනතුරට පත් සියලුම නිලයින්ගේ



16 එජාසාබ අණදෙන නිලධාරි
නි/60673 කර්නල්
එම්එම් කිත්සිරි ආර්එස්පී



රෙපිමුබ ශ්‍රීලපාහ අණදෙන නිලධාරි
නි/61525 ලුතිතන් කර්නල්
එම්ජීආර් ගුණසේකර ආර්එස්පී ශ්‍රීලපාහ



රෙම ශ්‍රීලපාහ මානි I (භකාස)
නි/61973 ලුතිතන් කර්නල්
ටීසීකේ පීරිස් ආර්එස්පී ශ්‍රීලපාහ



16 එජාසාබ දෙවන අණදෙන නිලධාරි
නි/61688 ලුතිතන් කර්නල්
ඩීජීකේ දිසානායක ආර්එස්පී ශ්‍රීලපාහ



4 ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි
නි/63673 මේජර්
ආර්ඒ ද සිල්වා ආර්එස්පී ශ්‍රීලපාහ



16 එජාසාබ බුද්ධි නිලධාරි
නි/65946 මේජර්
ඒඑස් රාජරත්න ශ්‍රීලපාහ



16 එජාසාබ විධායක අධිකාරි
නි/65919 මේජර්
එච්ජීජේකේ ආරච්චි ශ්‍රීලපාහ



7 ශ්‍රීලපාහ විධායක අධිකාරි
නි/65609 කපිතාන්
කේජීආර්එන් කුමාර ශ්‍රීලපාහ



6 ශ්‍රීලපාහ බුද්ධි නිලධාරි
නි/67930 ලුතිතන්
කේවීඑස්කේ විතානගේ ශ්‍රීලපාහ



16 එජාසාබ රෙජිමේන්තු සැරයන් මේජර්
සෙ/302360 ඔනි I
ඩබ්ලිව්පී සරත්



රෙපිමුබ ශ්‍රීලපාහ
රෙජිමේන්තු සැරයන් මේජර්
සෙ/304113 ඔනි I
ආර් ජයන්ත කුමාර



18(සේවා) ශ්‍රීලපාහ
රෙජිමේන්තු සැරයන් මේජර්
සෙ/17ඩී00009 ඔනි I
බීඑම්යුකේ රුද්දගොඩ

# වූ ඩබට රෙජිමේන්තු අධිපති ඇතුළු උණුසුම් සුබ පැතුම්...!



23 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි
නි/62421 මේජර්
එස් විජේසිරිවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ



12 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි
නි/62451 මේජර්
ඩීඑස්එස් රදලගේ ආර්එස්පී ශ්‍රීලපාහ



15 ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි
නි/63985 මේජර්
ටීඩබ්ජීඩීඑම් අමරසිංහ පීඑස්සී ශ්‍රීලපාහ



25 ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි
නි/63548 මේජර්
බීඒ ලියනරත්න ආර්එස්පී ශ්‍රීලපාහ



6 ශ්‍රීලපාහ විධායක අධිකාරි
නි/66490 කපිතාන්
පීජීඒපී ජයවර්ධන ශ්‍රීලපාහ



රෙම ශ්‍රීලපාහ මානි III (භකාස)
නි/66534 කපිතාන්
ඊඒටීඩී එදිරිසිංහ ශ්‍රීලපාහ



7 ශ්‍රීලපාහ බුද්ධි නිලධාරි
නි/67994 ලුතිතන්
එම්ඒජීඒ නිලංග ශ්‍රීලපාහ



රෙම ශ්‍රීලපාහ ප්‍රමානි III (ක්‍රියා/පුහුණු)
නි/68253 ලුතිතන්
ඒපීයූඒඑස් අධිකාරි ශ්‍රීලපාහ



16 එජාසාසාබ ප්‍රධාන ලිපිකරු
සෙ/303794 බනි II
වික්‍රමාදර ඩීඑන්



6 ශ්‍රීලපාහ රෙජිමේන්තු සැරයන් මේජර්
සෙ/304043 බනි II
රත්නායක ආර්එම්ඒකේ



6 ශ්‍රීලපාහ සරඹ උපදේශක
සෙ/303633 වර්ණ සැරයන්
රත්නසිරි ඩීඑම්



4 ශ්‍රීලපාහ සරඹ උපදේශක
සෙ/307019 වර්ණ සැරයන්
මාරක්කුලි එම්එච්පී

# පෙර දැනුමෙන් සන්නද්ධව 'සේවය කරමි' කිත් පැසසුම් මැද



පාඨමාලාවේ ප්‍රථම ස්ථානය හිමිකරගත්
නි/64551 මේජර් බීජීජ් රූපසිංහ ශ්‍රීලපාහ



පාඨමාලාවේ දෙවන ස්ථානය හිමිකරගත්
නි/5295 මේජර්
එන්බීජ්යූකේ නිශ්ශංක ආර්එස්පී ශ්‍රීලපාහ

ශ්‍රී ලංකා යුද හමුදා මූලස්ථානය විසින් සංවිධානය කර සන්නද්ධ බුද්ධි පාසල (MITS) පැලවත්ත හීදි පවත්වන ලද විශේෂ බුද්ධි පාඨමාලාව 2012.09.03 දින සිට 2012.09.27 වන දින දක්වා පුරා දින 24ක කාලයක් තුළ පැවත් විය. මෙම පාඨමාලාව සඳහා විශේෂ බුද්ධි රාජකාරින් හී නියුතු ශ්‍රී ලංකා යුද හමුදාවේ විවිධ රෙජිමේන්තු නියෝජනය කරමින් නිලධාරින් 05 දෙනෙකු සහ සෙසුනිලයින් 60 දෙනෙකු සහභාගි වූහ. මාස 03 ක කාලයකට සැලසුම් කළ මෙම විශේෂ මූලික බුද්ධි පාඨමාලාව පවතින රාජකාරි අත්‍යවශ්‍යතාවය මත දින 24කට සීමා විය.

මෙහිදි බුද්ධි නිලධාරියකු හා බුද්ධි ක්‍රියාකරුවෙකු ලෙස රාජකාරි කිරීම සඳහා අත්‍යවශ්‍ය න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම හා පන්නරය මනාව උකහාගනිමින් එම පාඨමාලාවේ පවතින අතිශය වැදගත්කම මැනවින් වටහා ගෙන දැඩි කැපවීමකින් සහ උනන්දුවකින් යුතුව මෙම විශේෂ මූලික බුද්ධි පාඨමාලාව සාර්ථකව නිම කිරීමට ශ්‍රීලපාහ රෙජිමේන්තුවෙන් සහභාගි වූ මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරින් සෑමවිටම කටයුතු කළහ.

**නි/64551 මේජර් බීජීජ් රූපසිංහ ශ්‍රීලපාහ**

**නි/5295 මේජර් එන්බීජ්යූකේ නිශ්ශංක ආර්එස්පී ශ්‍රීලපාහ**

පාඨමාලාවට සහභාගී වු අනෙකුත් සියලුම නිලයන්ට අභියෝගයක් වෙමින් සන්නද්ධ බුද්ධි පාසල් ඉතිහාසයේ සුවිශේෂ මතකයක් සනිටුහන් කරමින් සන්නද්ධ පුහුණු පාසල් සේනාවිධායක විසින් පිරිනමනු ලබන විශිෂ්ටතම නිලධාරියාට හිමි රන් පදක්කම ප්‍රථම වරට දිනා ගැනිමටත්, පාඨමාලාවේ සෙස්සන් අභිබවා ප්‍රථම ස්ථානය හිමිකර ගැනිමටත්, 7 ශ්‍රීලපාහ ඒකකයේ නි/64551 මේජර් බීජීජ් රූපසිංහ ශ්‍රීලපාහ සමත් විය. එම පාඨමාලාවේ දෙවන ස්ථානය හිමිකර ගැනීමට 5 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයට අයත් නි/5295 මේජර් එන්බීජ්යූකේ නිශ්ශංක ආර්එස්පී ශ්‍රීලපාහ සමත්විය. මෙම සුවිශේෂි ජයග්‍රහණ ඒකකයන්ට මෙන්ම පොදුවේ ශ්‍රීලපාහ රෙජිමේන්තුවට මහත් ගෞරවයකි. ඔබ දෙපල විසින් ශ්‍රීලපාහ රෙජිමේන්තුවට ගෙන දුන් මෙම ගෞරවය වෙනුවෙන් රෙජිමේන්තු අධිපතිතුමා ඇතුලු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම් මෙසේ එක් කරන්නෙමු.



පදක්කම් හා සම්මාන ලබාගනිමින්

මෙම පාඨමාලාවේ විශිෂ්ට කුසලතා දක් වූ මේජර් බීජීජ් රූපසිංහ දමිළ භාෂාව මනාලෙස හැසිරවීමට අතිදක්ෂයකු වන අතර, ශ්‍රීලකාහ රෙජිමේන්තු මධ්‍යස්ථානය හා ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද වීර පදක්කම් ප්‍රදානෝත්සවයන් හීදි දමිළ භාෂාවෙන් නිවේදන කටයුතු සිදු කිරීම, ආසේමු (කිළි) ආඥාපති, 57වන සේනාංකාධිපති, 571වන බලසේනාධිපති යන ජ්‍යෙෂ්ඨ නිලධාරින් හට දමිළ භාෂා පරිවර්තන රාජකාරි හා යුද හමුදා සිවිල් සම්බන්ධීකරන රාජකාරි සිදු කිරීම යන රාජකාරී දැනුමෙන් ලද පන්නරයෙන් මෙම අති විශිෂ්ට ජයග්‍රහණය ලබා ගන්නා ලදී. ඔබ විසින් ලබාදුන් කීර්තිය අප සදා අගයන අතර ඔබගේ ඉදිරි හමුදා ජීවිතය වෙනුවෙන් සුබ පතන්නෙමු.

හිමිකරගත් පදක්කම්



# ආසේමූ (කිලි) අන්තර් ඒකක නිරායුද සටන් කලාවේ ශූරයෝ 20 ශ්‍රීලපාහ



ආසේමූ (කිලි) ආඥාපති මේජර් ජෙනරාල් ජීවීඩීයූඑ් උදය පෙරේරා ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ සංකල්පයකට අනුව කිලිනොච්චි බළප්‍රදේශය තුළ ස්ථාපිත සියලුම බළඇණි නියෝජනය කරමින් 2012.08.06 දින සිට 2012.08.16 දින දක්වා කාලසීමාව තුළදී කමාන්ඩෝ රෙජිමේන්තු විශේෂ සංග්‍රාමික පුහුණු පාසල වෙඩිතලතිව් හී නිරායුද සටන් කලාව ප්‍රගුණ කිරීමේ පාඨමාලාවක් (BASIC UNARMED COMBAT COURSE) පවත්වන ලදී.

මෙම පාඨමාලාව සඳහා ඒකකය වෙතින් හටපිරිස් තෝරා ගැනීම ඒකක අණදෙන නිලධාරි නි/62548 මේජර් අයිපී ජයසිංහ ශ්‍රීලපාහගේ මගපෙන්වීම යටතේ සිදු කළ අතර, ඒ සඳහා කෙනි/58149 2/ලුතිතන් එච්එච්පී මදුරංග ශ්‍රීලපාහ, සෙ/319147 කෝප්‍රල් සුධර්ම එච්කේ, සෙ/323487 ලාකෝ සම්පත් ඩීඑච්ජේ යන අයවලුන් රපෝර්තු කරවන ලදී.සෑම ඒකකයක් වෙතින්ම විශිෂ්ටයන්ගේත් විශිෂ්ටයන් සහභාගීවී සිටීම මෙම පාඨමාලාවට



සුවිශේෂිත්වයක් එක්වී තිබුණි. නමුත් ඒ සියල්ලන් පරදවා අති විශිෂ්ටයන් බවට පත්වීමට 20 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට හැකි විය. දක්ෂයින් අතුරින් දක්ෂයින් වීම සුලුකොට තැකිය හැකි කාර්යයක් නොවන බව අප කාගේත් මතයයි. එසේ නම් එය ජය ගැනීමට උත්සාහය, අධිෂ්ඨානය හා කැපවීම උසස් අන්දමින් සිත් තුළ ධාරණය වී තිබිය යුතුය. මෙම උත්සාහය හා අධිෂ්ඨානය නැමති මාර්ගය වෙත සෙබළුන් යොමු කිරීමට වගබලාගත් එකම බලවේගය වෙන කවුරුත් නොව අප ඒකක අණදෙන නිලධාරිතුමා බැව් සනිටුහන් කරනුයේ හදපිරි සතුටිණි. එතුමාගේ මගපෙන්වීම යටතේ පාඨමාලාවට සහභාගි කරවන ලද මෙම තිදෙනා පාඨමාලාව ඉතා සාර්ථකව හා විනයගරුක ලෙස හදාරා ආසේමූ කිලිනොච්චි බළප්‍රදේශය තුළ ස්ථාපිත ඒකක 36 ක් තුළින් ප්‍රථමස්ථානය මෙම ඒකකය වෙත ගෙන ඒම මෙම බළඇණියටත්, සමස්තයක් වශයෙන් පාබල හමුදා රෙජිමේන්තුවෙත්, අභිමානය ඔප්නංවන අතර, පැවරෙන ඕනෑම රාජකාරියක් ඕනෑම වාතාවරණයක් තුළ ඉටු කිරීමට පාබල මැණියන්ගේ පුතනුවන්ට ඇති හැකියාව මෙයින් විදහා පාන අතර, "**සේවය කරමි**" යන්න පෙරදැරි කර ගනිමින් 20වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව පාබල අඹරේ දිලෙණ තරුවක් බවට පත් කිරීමට පාබල පුතනුවන්ට හැකි වේවා.

බුද්ධි අංශය 20 ශ්‍රීලපාහ

# 18 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ ප්‍රජා සත්කාර

කිලි/මාසාර් රජයේ දෙමළ මිශ්‍ර පාසලේ ඉගෙනුම ලබන ජිවාසි ආරති නැමති සිසුවිය මෙවර ශිෂ්‍යත්ව විභාග යෙන් ලකුණු 154ක් ලබාගෙන සමත් වී ඇත. මෙම ඒකක බළප්‍රදේශයේ පිහිටි පාසල් හී 5 වසරෙහි ඉගෙනුම ලබන සිසු සිසුවියන් අතුරින් මෙවර ශිෂ්‍යත්ව විභාගය සමත් එකම සිසුවිය ඇය වේ.



63 වන යුද හමුදා දිනය වෙනුවෙන් රුපියල් 5,000.00ක් පමණ වටිනා පාසල් උපකරණ ඇතුළත් තිළිණයක් ඇය වෙනුවෙන් ලබාදීමට මෙම ඒකකය වෙතින් සැලසුම් කර තිබු අතර, එම පාසල් උපකරණ පරිත්‍යාග කිරීම ඒකක අණදෙන නිලධාරි මේජර් ඩබ්ලිව්ජ්වයිකේ වීරසිංහ ශ්‍රීලපාහගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී. මෙම අවස්ථාවට ඒකක දෙවන අණදෙන නිලධාරි මේජර් එච්එම්පීසී හේරත් ශ්‍රීලපාහ සහ "බී" කණ්ඩායම් නිලධාරි අණදෙන මේජර් ඩීඑස්පීකේ ද සිල්වා ශ්‍රීලපාහ හා එම පාසලේ විදුහල්පතිනිය ද සහභාගි විය.

**2/ලුතිතන් එස්ආර්ඒආර්ඩබ්ලිව් සමරක්කොඩි ශ්‍රීලපාහ**
**බුද්ධි නිලධාරි 18 (සෙව්) ශ්‍රීලපාහ**

# කිලිනොච්චි ගාන්ධි නිලයම් ළමා නිවාසයට නව ළමා උද්‍යානයක්




දශක තුනකට අධික කාලයක් තිස්සේ පැවති යුද්ධය නිසා දේපල හා ජන ජීවිත විශාල ප්‍රමාණයක් ලක් මැණියන්ට අහිමි වී ඇත. නමුත් අද වන විට සාමයේ අරුණලු විවර වීමත් සමගම එම ජන ජීවිතයන්ට යම්තාක් දුරට සැනසුම් සුසුම් හෙලන්නට අවස්ථාව උදා වී ඇත. එනමුදු සිය දෙමාපියන්ගේ රැකවරණයක් නොමැතිව මෙම සැනසුම් සුසුම් අතුරින් අනාගතය දකින්නට වෙර දරනා කිලිනොච්චිය උර්තිරපුරම් නැගෙනහිර ග්‍රාමයේ ගාන්ධි නිලයම් ළමා නිවාසයේ දරුවන් කෙරෙහි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීවීඩීයූ පෙරේරා ආර්එස්පී යූඑස්පී පීඑස්සී තුමන්ගේ හදවතේ ඇති වූ අසීමිත සෙනහස හා අනුකම්පාව හුවා දක්වමින් මෙම ළමා නිවාසයට අඩුපාඩුවක්ව පවතින ළමා උද්‍යානයක අවශ්‍යතාවය සොයාබලා ඇවසි කටයුතු සිදු කරන ලදී. ඒ අනුව මෙම ළමා උද්‍යානය නිර්මාණය කිරීමේහිලා ඇවසි සම්බන්ධීකරන උපදෙස් අඥාපති විසින් ලබාදෙන ලදී.

එතුමන්ගේ උපදෙස් පරිදි මෙම ළමා උද්‍යානය දෙමාපිය රැකවරණය අහිමි දරුවන් වෙනුවෙන් ඉදි වූ අතර, ළමා නිවාසයේ දරුවන් වෙනුවෙන් හා එම ප්‍රදේශයේ සිටින අහිකුත් ළමයින්ගේ ප්‍රයෝජනය උදෙසා 2012.08.04 විවෘත කරන ලදී. මෙම මහා පිංකම වෙනුවෙන් 7 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එච්වීජ් සෝමවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහගේ පූර්ණ මග පෙන්වීම



යටතේ සහෝදර සෙබළුන්ගේ ශ්‍රමදායක්වයෙන් ළමා උද්‍යානය ඉදි කිරීමට හැකි වූ අතර, ඩුබායි රාජ්‍යයේ පදිංචි මිරංජි අබේසිංහ ඇතුලු නෑ හිතවතුන් පිරිසක් මූල්‍යමය දායකත්වය දරන ලදී.

කුඩා දරුවන්ගේ ක්‍රීඩා කෞශල්‍ය වැඩි දියුණ කිරීම සඳහා ක්‍රීඩා භාන්ඩ රැසක්ද බෙදා දුන් අතර, ඉදි වූ ළමා උද්‍යාන විවෘත කරනා අවස්තාව සඳහා 57 සේනාංකාධිපතිතුමා, 212 බලසේනාධිපතිතුමා, 7 ශ්‍රීලපහ ඒකකයේ අණදෙන නිලධාරි, සෙබළුන් ඇතුලු ප්‍රදේශවාසින් ද, දරු දැරියන් විශාල පිරිසක් ද සහභාගි විය.

තම දරුවන් මහමගට දමන ගඟේ දොලේ දමන කලියුග කාලයේ දෙමාපියන් සිටින මෙවැනි යුගයක ඔවුන්ට ආදර්ශයක් ලබා දෙමින් සිදු කළ මෙම වැයමට ආරක්ෂක සේනා අඥාපති තුමන් හට අපගේ හදපිරි ප්‍රනාමය පුද කරන්නෙමු.

බුද්ධි අංශය - 7 ශ්‍රීලපාහ

# කොනොනි සමාජ ශාලාවට පරිත්‍යාගයක්



16වන එක්සත් ජාතින්ගේ සාමසාධක බළඇණිය වෙත සහභාගි වූ ශ්‍රීලපාහ කොනොනින් විසින් රෙම ශ්‍රීලපාහ කොනොනි සමාජ ශාලාවේ අඩුපාඩුවක්ව පැවති පානීය ජලය ශිත කිරීමේ යන්ත්‍රයක් රුපියල් 120000.00ක් වැයකර 2012.08.30 දින 1037 ට යෙදුනු සුබ මොහොතින් රෙම ශ්‍රීලපාහ සමාජ ශාලාවේ දී ජොෂ්ඨ කොනොනි හට පරිත්‍යාග කරන ලදි.

කොනොනි සමාජ ශාලාව රෙම ශ්‍රීලපාහ

# දෙවන වියට පාතැබූ 25 ශ්‍රීලපාහ



කුරිරු ත්‍රස්තවාදීන් විසින් වන්නි ප්‍රදේශයේ සිරකරගෙන සිටි අහිංසක මිනිසුන් පළිහක් ලෙස යොදා ගනිමින් සිටි අවධියේ ඔවුන්ව නිදහස් කර ගැනීමේ පරම අභිලාශයෙන් වන්නි මානුෂීය මෙහෙයුම ආරම්භ කරන ලදී. මානුෂීය මෙහෙයුම ආරම්භයේ සිට රණවිරුවන් කුරිරු ත්‍රස්තවාදීන්ට දැඩි ප්‍රහාර එල්ල කරමින් ත්‍රස්තවාදී මර උගුල්, බිම්වෙඩි කෙත් ඉතා සාර්ථකව මග හරවා ගනිමින් ඉදිරියට ගමන් කළහ. ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාර හමුවේ රණබිමේ මියයාම් සහ තුවාල ලබා රණබිමෙන් ඉවත් වෙන සෙනින්ගේ අඩුව පිරවීම සඳහා තුවාල ලබා ආබාධිත තත්ත්වයට පත්ව සිටි නිලධාරි සහ සෙනින්ගෙන් සමන්විත බළඇණියක් ලෙස 2008.10.01 දින කල්මඩු ප්‍රදේශයේදී මෙම ඒකකය ආරම්භ කරන ලදී. එය ක්‍රියාන්විත රාජකාරි සඳහා ඉදුරාම සම්බන්ධ වන ආබාධිත පුද්ගලයන්ගෙන් සැදුම්ලත් ශ්‍රී ලංකාවේ පළමු අධාරක බළඇණිය විය.

මෙසේ ආරම්භ කරන ලද පළමු අධාරක බළඇණිය ශ්‍රීලපාහ වන්නි මානුෂීය මෙහෙයුම නිමාවෙන් පසු නව ඒකක නගා සිටුවීම යටතේ 2010.09.20 දින 25වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වශයෙන් වශයෙන් ස්ථාපනය විය. 25 ශ්‍රීලපාහ ආරම්භ කර වසර දෙකක් සපිරීම 2012.09.20 වන දිනට යෙදී තිබුණි. මෙම බලඇණි මූලස්ථානය කිඩාවුර් ප්‍රදේශයේ ස්ථානගතව ග්‍රාම සේවා වසම් 12ක් ඇතුළත්ව බළඇණි බළප්‍රදේශයේ වර්ග කිලෝ මීටර් 246ක භූමි ප්‍රමාණයක රාජකාරි කරමින් ප්‍රදේශයේ නැවත පදිංචි කරන ලද ජනතාවගේ ජන ජීවිතය නගා සිටුවීමේ මහගු කාර්යයක යෙදෙමින් රාජකාරි බහුල අවස්ථාවක සිටියත් අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එස්ඩබ්ලිව්ආර් ප්‍රසන්න ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ විසින් ඒකකයේ සියලු නිලධාරින් සහ ජ්‍යොකොනොනින් ඇතුළත් සියලුම දෙනා ඉතා ඇප කැප වීමෙන් දෙවන සංවත්සරය ඉතා අභිමානවත් ලෙස සැමරීමට කටයුතු කරන ලදී.




ආගමික වතාවත් වලට මුල් තැන දෙමින් ඒකක සංවත්සරය පවත්වන ලද අතර, පළමු අදියර ලෙස 2012.09.17 දින අනුරාධපුර ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ අභියස බෝධි පූජාවක් පවත්වා ඒකක ධජයට සහ ඒකකයේ අභිවෘද්ධියට සෙත් ප්‍රාර්ථනා කරන ලදී. ඉන් පසු 2012.09.18 වන දින ක්‍රිස්තියානි බැති මතුන්ගේ පරම පූජනීය ස්ථානයක් වන මඩු දේවස්ථානයට ගොස් මඩු මෑණියන්ගේ ආශිර්වාදය ඒකක ධජයට සහ ඒකකයේ සියලුම දෙනා වෙත ලබා ගන්නා ලදී. 2012.09.13 කිඩාවුර් පත්තිනි දේවාලය වෙත පූජාවක් පවත්වා ආශිර්වාදය ලබා ගැනීමෙන් පසු 2012.09.20 දින බළඇණි දෙවන උපන් දිනය සමරා අණදෙන නිලධාරි වෙත අභිමානවත් කඳවුරු සම්මාන මුරයක් ලබාදෙන ලදී. ඉන් පසු අණදෙන නිලධාරි විසින් ඒකක ධජය ඔසවා රෙජිමේන්තු ගීතය ගායනා කර වැඩ කටයුතු ආරම්භ කර බළඇණියේ සියලුම දෙනා අමතා හරවත් දේශණයක් පවත්වන ලදී. එදින සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් පවත්වා බළඇණි සංවත්සරයේ උත්සව කටයුතු ඉතා අභිමානවත් අයුරින් නිමාවට පත් කරන ලදී.




**බුද්ධි අංශය 25 ශ්‍රීලපාහ**

# බළඇණි පුහුණුවීම් සාර්ථකව නිම කළ 20 ශ්‍රීලපාහ



662 වන බළසේනා මූලස්ථානයට අනියුක්තව නිත්‍ය බළඇණියක් වශයෙන් අක්කරායන්කුලම් ප්‍රදේශයේ රාජකාරි කටයුතු වල නියැලී සිටින 20 ශ්‍රීලපාහ ඒකකයේ සියලුම නිලධාරි හා සෙනින්ගේ හමුදාමය යුද උපක්‍රමික දැනුම හා සාමුහිකත්වය වර්ධනය කිරීමට 66 සේනාංක මූලස්ථාන බළඇණි පුහුණු පාසලේදී 2012.08.20 දින සිට 2012.09.28 දින දක්වා කාලය තුළ දක්ෂ උපදේශක මඩුල්ලක මග පෙන්වීම යටතේ සාර්ථක බළඇණි පුහුණු පාඨමාලාවක් හදාරන ලදී.

ඒකක අණදෙන නිලධාරි නි/62548 මේජර් අයිපී ජයසිංහ ශ්‍රීලපාහ පාඨමාලාව ආරම්භ කිරීමට ප්‍රථම සියලුම දෙනාගේ චිත්ත ධෛර්ය වර්ධනය කිරීම වෙනුවෙන් පාලන කටයුතු පිළිබඳ සුපරික්ෂාකාරීව සොයාබලා බළඇණිය ක්‍රමවත් පුහුණුවක් සඳහා සූදානම් කරන ලදී. සැලසුම් කරගත් පරිදි 2012.08.20 දින 0730 පැයට පුහුණු සමාරම්භය සනිටුහන් කරමින් ආරම්භක දේශණය 663 බළසේනාධිපති කර්නල් එන්කේඑල් සමරසිංහ අයිජී විසින් සිදු කරන ලදී.



පුහුණුවීම් ආරම්භයේ සිට ඒකකයේ අණදෙන නිලධාරි, දෙවන අණදෙන නිලධාරි සහ රෙජිමේන්තු සැරයන් මේජර් විසින් සියලු දෙනා දිරිමත් කිරීම අප ලද මහඟු අවස්ථාවක් බැව් කියනුයේ ඉතාමත් අභිමානයෙන් යුතුවය.

පාඨමාලාව ආරම්භයේ සිට මහත් උනන්දුවකින් හා උද්යෝගයකින් යුතුව පාඨමාලාව හැදෑරූ 20 ශ්‍රීලපාහ භටපිරිස් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ, විවිධ දේශණ, ප්‍රායෝගික පුහුණුවීම්, කොම්පාසු සංචාර, මාර්ග බාධක, නගරබද සටන්, බාධක තරණ, වෙහෙසකර පාගමන යන විෂයන්ට අමතරව ජීව වෙඩිතැබීම් ද සිදු කළ අතර, කණ්ඩායම් නිලධාරි අණදෙනවරුන් ද තම කණ්ඩායම් නිවැරදි මාර්ගයට ගනිමින් ඉතා උනන්දුවකින් පුහුණුවීම් කටයුතු ඉතාමත් සාර්ථකව විනයගරුක ලෙස පවත්වාගෙන යාමට මනාව කටයුතු කළහ.

පාඨමාලාව අතර තුරදී කණ්ඩායම් අතර විවිධ තරග ඉසව් ද සංවිධානය කර තිබුණි. පාඨමාලාවේ අවසන් දේශණය 66 සේනාංකාධිපති බ්‍රිගේඩියර් කේඒසීඑච් කොඩිතුවක්කු අයිජී විසින් 2012.09.28 දින පවත්වා පාඨමාලාව තුළදී දක්ෂතා දැක්වූ නිලධාරි හා සෙසුනිලයින් හට කුසලතා සම්මාන පිරිනැමීම ද සිදු කරන ලදී. මෙම විශේෂ අවස්ථාව සඳහා 661, 662 සහ 663 බළසේනාධිපති වරුන් ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරි රැසක් සහභාගි වූහ. මෙම බළඇණි සාමූහික පුහුණුවීම් තුළින් ඒකකයේ සිටින සියලුම නිලධාරි හා සෙසුනිලයින්ගේ



කුසලතා උසස් මට්ටමකට ගෙන ඒමට හැකිවූ අතර, බළඇණි පුහුණුවීම් තුළින් ලබාගන්නා ලද පන්නරය ඒකකය වෙත පැවරෙන ඕනෑම රාජකාරියක් කාර්යක්ෂමව හා ඵළදායීව ඉටු කිරීමට අත්වැලක් වන බව නොඅනුමානය.

**බුද්ධි අංශය 20 ශ්‍රීලපාහ**



# 4 ශ්‍රීලපාහ ඒකකයෙන් තවත් ප්‍රජා සත්කාරයක්



දශක තුනක් පුරා පැවති ත්‍රස්තවාදය නිමාවත් සමගම යුද හමුදාව සිවිල් ජන ජීවිතය නඟා සිටුවීම සඳහා උදාරතර මෙහෙවරක නිරතව සිටී. එහි එක් කර්තව්‍යක් වනුයේ අඩු ආදායම් ලාභි දිලිදු පවුල් සඳහා නව නිවාස ඉදිකර පරිත්‍යාග කිරීමයි. ආසේමු (මු) ආඥාපති මේජර් ජෙනරාල් එල්බීආර් මාර්ක් ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ සංකල්පයක් මත 59 සේමු සේනාංකාධිපති බ්‍රිගේඩියර් ජීආර්එච් ඩයස් යූඑස්පී පීඑස්සී අයිජී හා 592 බසේමු බළසේනාධිපති බ්‍රිගේඩියර් එස්ජ්ආර් සමරසිංහ ආර්එස්පී යූඑස්පී යන නිලධාරින්ගේ මගපෙන්වීම යටතේ 4වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරි මේජර් ජීඩීජේසී ප්‍රේමතිලක පීඑස්සී ශ්‍රීලපාහ ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ඒකක නිලධාරි සෙසුනිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුමාරපුරම් ග්‍රාම සේවා වසමේ පදිංචි සුභ්‍රමනියම් තම්ල්වෙල්වම් යන අය හට නව නිවසක් සාදා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආසේමු (මු) ආඥාපති හා ආසේමු (මු) බලප්‍රදේශයේ සේනාංක, බළසේනා මූලස්ථාන, ඒකකයන් හී සේනාංකාධිපතිවරු, බළසේනාධිපතිවරු හා ඒකක අණදෙන නිලධාරින් ඇතුලු නිලධාරි සෙසුනිලයින් විශාල පිරිසකගේ හා ප්‍රදේශයේ සිවිල් වැසියන්ගේ සහභාගිත්වයෙන් 2012.09.23 දින උත්සවශ්‍රීයෙන් විවෘත කොට භාර දෙන ලදී.



මේ සඳහා රුපියල් 350,000.00 ක මුදලක් වැය වූ අතර, එම මුදල ඇන්තනී බ්‍රිටෝ එස් අරවින්දන්, කේ ප්‍රසාද් සහ බී සුදාහරන් යන මහත්වරුන් විසින් පරිත්‍යාග කරන ලදී. 2012.09.25 දින මුලතිව් ප්‍රදේශයේ සංචාරයක් සඳහා පැමිණි රාජ්‍ය ආරක්ෂක ලේකම් ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාද මෙම නිවස නැරඹීම සඳහා පැමිණ ඒකකය විසින් මුලතිව් ප්‍රදේශයේ සිවිල් පරිපාලනය නඟා සිටුවීම සඳහා සිදුකරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳව ඇගයීමට ද ලක් කරන ලදී.

බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ









# 12 ශ්‍රීලපාහ නව අණදෙන නිලධාරී

12 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි කළ නි/61668 ලුතිතන් කර්නල් ඒඑම්සීපී විජයරත්න ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ ඒකකයෙන් නික්ම යාමත් සමඟ 2012.10.26වන දිනය ඒකකයට සුවිශේෂ දිනයක් විය. එදින 12 ශ්‍රීලපාහ ඒකකයේ තෙවන අණදෙන නිලධාරි වශයෙන් නි/62451 මේජර් ඩීඑස්එස් රදලගේ ආර්එස්පී ශ්‍රීලපාහ සිය තනතුරේ රාජකාරි භාරගන්නා ලදී. ඒකකය වෙත පැමිණි නව අණදෙන නිලධාරි වෙත සම්මාන මුරයක් පිරිනමනු ලැබූ අතර, සුබ මොහොතින් සම්ප්‍රදානුකූලව පොල්තෙල් පහන දල්වා අනතුරුව සිය තනතුරේ රාජකාරී භාරගන්නා ලදී. සියලුම නිලයන් විසින් පිළියෙල කරන ලද තේපැන් සංග්‍රහය ද, නව අණදෙන නිලධාරි හට පිළිගැන් වීමෙන් පසු ඒකකයේ දෙවන අණදෙන නිලධාරි ඇතුලු සියලුම දෙනා නව අණදෙන නිලධාරි හට සුබ ප්‍රාර්ථනා කිරීමට එක්වී සිටිහ. නව අණදෙන නිලධාරි තුමනි ඔබ තුමන් හට ඒකකයේ කීර්ති නාමය තව තවත් ඉදිරියට ගෙන යාමට සියලු ශක්තිය හා ධෛර්ය ලැබේවායි එක සිතින් ප්‍රර්ථනා කරන්නෙමු.

බුද්ධි අංශය 12 ශ්‍රීලපාහ

# ශ්‍රීලපාහ මුලස්ථාන බළඇණියේ නව අණදෙන නිලධාරීගේ සම්ප්‍රාප්තිය

රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය ශ්‍රීලපාහ අටවන අණදෙන නිලධාරි වශයෙන් නි/61525 ලුතිනන් කර්නල් එම්ජ්ආර් ගුණසේකර ආර්එස්පී ශ්‍රීලපාහ 2012 අගෝස්තු මස 6 දින වැඩ භාර ගන්නා ලදී.

නව අණදෙන නිලධාරි වෙත හටපිරිස් විසින් සම්මාන ආචාර මුරය පිරිනැමීමෙන් අනතුරුව යෙදී තිබුන සුබ මොහොතින් සම්ප්‍රදායාණුකූලව පිරිත් සජ්ඣායනා මැද ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය ඇතිව රෙජිමුඛ ශ්‍රීලපාහ නිලධාරින් ඇතුලුව සියලුම නිලයින්ගේ සුබාසිංශණ මධ්‍යයේ අණදෙන නිලධාරි විසින් නව තනතුරේ රාජකාරි භාර ගෙන ඉන් පසු සියලු නිලයින් විසින් පිළියෙල කරන ලද තේ පැන් සංග්‍රහයට සහභාගි විය.

ඉන් අනතුරුව සියලු නිලයන් අමතා හරවත් දේශනයක් කළ අතර, අණදෙන නිලධාරි වසර 23ක තම යුද්ධ හමුදා ජීවිතයෙන් ලද පන්නරය හා අත්දකීම් සහිත යුද්ධ හමුදාවේ වග කිව යුතු ස්ථාන රැසක රාජකාරි කර මෙම ඒකකයේ නව අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි කිරීමට ලැබීම ගැන ඉමහත් සතුටට පත්වන බවත්, මෙම බළඇණිය ශ්‍රීලපාහ ඒකක අතර, ඉහළම ස්ථානයක රැදවීම සඳහා සියලු නිලයන්ගේ සහයෝගය අපේක්ෂා කරන බවත් පැවසීය.

නව අණදෙන නිලධාරි තුමාහට රෙජිමේන්තු මුලස්ථාන බළඇණිය ශ්‍රීලපාහ ඒකකයන් අතුරින් සුවිශේෂ ඒකකයක් බවට පත් කිරීමට අවශ්‍ය නායකත්වය,මග පෙන්වීම ලබාදීමට අවශ්‍ය ශක්තිය, ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.





මුලස්ථානය රෙජිමුඛ ශ්‍රීලපාහ

# රෙජිමේන්තු සංවත්සරයේදී හොඳම (නිත්‍ය) බළඇණිය 1 ශ්‍රීලපාහ ට

> **හොඳම බළඇණියට හිමි සම්මානය සහ ක්‍රීඩා අතින් දක්ෂතම බළඇණියට හිමි සම්මානය 1 ශ්‍රීලපාහ ඒකකය හිමි කරගත් අතර, සෙබළුන්ගේ සාමුහික හැකියාවන් හා විනය පවතිනුයේ සරඹ මත බැව් මනාව ඔප් නංවමින් අන්තර් ඒකක සරඹ තරඟාවලියේ අනුශූරතාවය හා ඒකක හොඳම ප්‍රධාන ලිපිකරුවාට හිමි සම්මානය ද සෙ/303658 බනි 11 ජයමාන්න එම්පීජී විසින් හිමි කර ගන්නා ලදී.**



පනාගොඩ යුද හමුදා කඳවුර රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී අභිමානවත් 132 වන රෙජිමේන්තු සංවත්සරය 2012.10.23 දින සමරනු ලැබුවේ යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි සහ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් හා රෙජිමේන්තු සේනාවිධායක කර්නල් කේජේ ජයවීර ආර්එස්පී ගේ මග පෙන්වීමෙ යටතේය. පාබල රෙජිමේන්තුවේ නිත්‍ය/ස්වෙච්ඡා ඒකකයන්ගේ අණදෙන නිලධාරිවරුන් ඇතුළුව නිලධාරීන් 76ක් සහ සෙසුනිලයින් 576 ගේ සහභාගීත්වයෙන් අභිමානවත් අයුරින් වර්ණ ධජ සහිත පෙළපාළියක් රෙජිමේන්තු අධිපතිතුමන් හට පිළිගන්වන ලදී.



ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ නිත්‍ය ඒකක 15ක් හා ස්වෙච්ඡා ඒකක 08ක් වෙනුවෙන් 'ප්‍ර', 'පා', 'භාකාස', 'ගිණුම', 'ක්‍රීඩා' හා 'පොදු' කටයුතු යන විෂයන් සඳහා තම කටයුතු නිසි අයුරින් ඉටු කිරීමෙන් හා උසස් මූලස්ථානයන් හි නිරීක්ෂනයන්ට ලක් නොවී ඒකකයේ පාලන කටයුතු මනාව ඉටු කිරීමෙහිලා හොඳම බළඇණියට හිමි සම්මානය සහ ක්‍රීඩා අතින් දක්ෂතම බළඇණියට හිමි සම්මානය 1 ශ්‍රීලපාහ ඒකකය හිමි කරගත් අතර, සෙබළුන්ගේ සාමුහික හැකියාවන් හා විනය පවතිනුයේ සරඹ මත බැව් මනාව ඔප් නංවමින් අන්තර් ඒකක සරඹ තරඟාවලියේ අනුශූරතාවය හා ඒකක හොඳම ප්‍රධාන ලිපිකරුවාට හිමි සම්මානය ද සෙ/303658 බනි 11 ජයමාන්න එම්පීජී විසින් හිමි කර ගන්නා ලදී.

මෙම සියලු ජයග්‍රහණ ලබා ගැනිමට ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඩබ්ලිව්එස්කේ ලියනවඩුගේ ශ්‍රීලපාහ ගේ නිසි මඟ පෙන්වීම තුළින් හා ඒකකයේ සේවයේ යෙදී සිටින/සේවය කර වෙනත් ස්ථානයන් හි රාජකාරි නියුතු සහ දැනට විශ්‍රාම ගොස් සිටින සියලුම අයවලුන්ගේ කැපවීම තුළින් ලබාගත් ජයග්‍රහණයන් බැව් මෙහිලා සිහිපත් කරන්නෙමු.

බුද්ධි අංශය 1 ශ්‍රීලපාහ





THE WHITE HACKLE

# මගේ හිමි සඳ නුඹයි

ඝන කලුවර රාත්‍රියට
නිබඳ පහන් එළියක් වී ...
හිරු ගිනිගෙන දැවෙනා ලොව
සිසිල් අමා පවනක් වී...
කුරිරු මිනිස් ලොව හමුවේ...
මා අභියස රැඳෙනා නුඹ..
මා දිවියේ අරුණැල්ලයි...

සාසෙ සාගර කේකේඩිගේ
ආදරණීය බිරිඳ සුගන්ධිකා

# වියෝ වූ සෙන්පතිඳුනි

ගතවිය දෙවිසි වසරක් - අහිමි වී ඔබව මව්බිමට
පිළිරුව් දෙයි ඔබගේ - ජයගොස මේ ලක් දෙරණේ
ඔබ අපගේ අණ නිරිඳුන් - පත්ව සිටි කෙටි කලදී
එම කල්හි අපගේ - බළඇණිය පුහුණු වූයේ
නව පුහුණු පාඨමාලා - ඇරඹුනි ඔබගේ නියමේ
සරඹ, ශාරීරික අභ්‍යාස - කැලෑබද සටන් හා ඇති
එම පුහුණු පාඨමාලා - නිසා ශක්තියක් වුනි
සෙබළ අපගේ සිත් - ත්‍රස්ත යුද්දෙට කොමා
තැබුයේ සාමය නිසා - පසුව ඇති වුනි මකා
සාමයට බාධා - අවිගත් සිහල ගැටවුන්
පෙළ ගැසි රටම කළඹා - එකල්හිද ඔබගේ ඔවදන්
අපට ලැබුනා වෙසෙසින් - නිරතුරුව ලක්මෑණී වෙන්වෙන්
ඔබ කළා සේවය සතොසින් - එහෙත් රුදුරු මිනිසුන්
හිමිකළා අපට සරදම් - කිපුනා බොහෝ දෙන ජන..
ඔබගේ වියෝවේ සංවේගයෙන් - හද නැගුන සෝ සුසුම්
අසරණ කළා දෙසුවන් - අපමණයි ඔබේ ගුණ
ගැයුනා වදන් පෙළ - "මේජර් ජෙනරල් " නමින්
ළෙලදුනා දකුණු ලක - "වුලාහය ලක්ෂ්මන් විජේරත්න "
නිරිඳුනි ලක්බිමේ නිරතුරු - සදාකල් රැඳේවා
ඔබගේ නාමය...

සෙ/2ඩී03721 බනි I එල්එස් කරුණාසේන 2 (සේවා) ශ්‍රීලපාහ
මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය යුද්ධ හමුදා මූලස්ථානය කොළඹ




# යථාර්ථය

හමුදාවේ හිටියා තුන් වසරක් විතර මම
නිවාඩු ගිය කල හිටියා යාලුවො පොකුරක්ම
ඇබ්සන් වුනා දින විස්සක්-තිහක් මම
බලූ පැටයෙක් වත් නෑ වැනුවේ වලිග නටුව

සෙ/324522 ලා/කෝ විමලරත්න එම්ජ්සීඑන්
15 ශ්‍රීලපාහ බී කණ්ඩායම

# මගේ අයියා

එදා ඔබ යුධ බිමේ
අවිඅතට ගත් දිනේ
දුකක් දැනුනා මගේ අයියේ
පුංචි නංගිගේ හදවතේ
තල් වැට මායිමේ අද
ඔබ සිටි ඈත කදවුරේ
ගිනි අවිය අත දරන්
ලක් මව සුරකිමින්
ආඩම්බරයි ආඩම්බරයි
පුංචි නංගිට ආඩම්බරයි
මගේ අයියා අද දිනේ
වීර පුතෙකු වි ජාතියේ
ජාතියේ විරු පුතෙකුගේ
නැගණියක් වන්නට මේ භවේ
පිං කරන්න ඇති මගේ අයියේ
මම පෙර ආත්මයේ
මගේ අයියාටත්
සියලු රණවිරු සොයුරන්ටත්
පතන්නෙමි එක සිතින් මම
දළදා සමිඳුගේ පිහිට ලැබේවායි...!

7 ශ්‍රීලපාහ ලාකෝ අරුණකුමාර ඩීඑම් ගේ
ආදරණීය නැගණිය බිජිඩීඑම් වික්‍රමරත්න

# බිඳුනු පෙම

දුර අතීතයේ ඔබ හා ඇවිද ගොසින්
ආසයි ආ මඟ අයේත් එන්නට
අප පෙම බිඳුනු තැනින් ...
ඔබ සිත මා සිත දෙලොවක රැඳුනා
නොසිතු නොපැතු ලෙසින් ගැටී
එනමුදු තාමත් සිහින මැවෙනවා
මතකය හදවත පතුලේ රැදී ...
බොළඳ සිහිනයකි මා සිත දකිනා
සැබෑ ලොවක ඉටු නොවුනු ඇති
එනමුදු තාමත් සිහින මැවෙනවා
මතකය හදවත පතුලේ රැදී ...

සාසෙ ප්‍රසන්න ටීඑස්
1 ශ්‍රීලපාහ

# මා ආදරණීය අම්මා

මා ඔබේ කුස තුළට ආ දා පටන්
ඔබ වින්ද දුක් ගැහැට අපමණයි අම්මේ
මා උපන් දා පටන් ඇගේ ලේ කිරි කරන්
මා ඇති දැඩි කරන්න ඔබ වින්ද වේදනා
අපමණයි අම්මේ ...
ඔබේ පුතු ලොකු වී යහපතෙකු කරන්නට
ඔබ වින්ද දුක් ගැහැට අපමණයි අම්මේ
ඔබ ගැන මතකයන් හද තුළට නැගෙද්දී
නෙත් මගේ තෙත් කර ගලා එන
දුක් සුසුම් අම්මේ ...
ඔබ වින්ද දුක් ගැහැටු මෙපමණයි කියන්නට
කවි වදන් නැත ලොවේ අප හදවත් තුළ
නැගෙනා ඉතින් මගෙ මෑණියනි
පතන්නෙම් එක සිතින් මතු මතුත්
ලැබෙන්නට මට මගේ මෑණියන් ...

ලාකෝ විජේනායක ඩබ්ලිව්එම්පීපී
1 ශ්‍රීලපාහ

# දසුනේ හසුන



බැල්මෙන් සොඳුරු සිනහව නොමසුරු දුන්න
ඇල්මෙන් අකුරු උගනට සිප්හල් යන්න
මල්මෙන් පිපිණු ඉත්තක එකටම ඉන්න
දැහැමෙන් ඉසුරු ලබනට පෙරමං යන්න

දසුන හා හසුන 8

මේජර් ඩබ්ලිව්ඩී ගුණරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ
14(සේවා) ශ්‍රීලපාහ

# නිවැරදි කිරීමයි

## නොමියෙන පාබල විරුවෝ

73 වන වයිට් හැකල් කලාපයේ පිටු අංක 08 හා 09 හී පළවූ නොමියෙන පාබල විරුවෝ ලිපියේ සෙ/317077 කෝප්‍රල් අබේසිංහ ඒඑම්එම්පී යන රණවිරුවාගේ ඡායාරූපය වෙනුවට, සෙ/319509 ලාකෝ දයානන්ද ටීජීඩීආර් යන රණවිරුවන්ගේ ඡායාරූපය ද, සෙ/319509 ලාකෝ දයානන්ද ටීජීඩීආර් යන රණවිරුවන්ගේ ඡායාරූපය වෙනුවට සෙ/317077 කෝප්‍රල් අබේසිංහ ඒඑම්එම්පී යන රණවිරුවාගේ ඡායාරූපය පළවී ඇති අතර, එය සැකසුම් කිරීමේදී සිදු වූ අතපසුවීමක් බැවින් ඒ පිළිබඳව කනගාටුව ප්‍රකාශ කර සිටින්නෙමු.

## රෙම ශ්‍රීලපාහ ජූඩෝ සංචිතයේ ජයග්‍රහණ

73 වන වයිට් හැකල් කලාපයේ පිටු අංක 37 හී පළවූ රෙම ශ්‍රීලපාහ ජූඩෝ සංචිතයේ ජයග්‍රහණ නැමැති ලිපියේ රෙම ශ්‍රීලපාහ ජූඩෝ කමිටුවේ සභාපති ලුතිතන් ජේඑල්ටීහේවා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ යනුවෙන් ප්‍රමාද දෝශයකින් පළ වී ඇති අතර, එය රෙම ශ්‍රීලපාහ ජූඩෝ කමිටුවේ සභාපති ලුතිතන් කර්නල් ජේඑල්ටීහේවා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ වශයෙන් නිවැරදි විය යුතුය. එම ජ්‍යෙෂ්ඨ නිලධාරී හට සිදු වූ අපහසුතාවය ගැන කනගාටුවව ප්‍රකාශ කරන්නෙමු.

වයිට් හැකල් කාර්ය මණ්ඩලය

# ප්‍රහේලිකා අංක 54

නිවැරදි විසඳුම්පත් 2013 අප්‍රේල් මස 15 වන දිනට පෙර එවිය යුතුය.

තරඟ කූපනය සහ කොන්දේසි පසු පිටෙහි ඇතුළත් කර ඇත.

## වයිට් හැකල් ප්‍රහේලිකාව - අංක 54

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 8 | 5 | 2 | 7 | 6 | | 4 |
| 7 | | 2 | | | | 1 | | 5 |
| 6 | 4 | | 1 | 9 | 3 | 2 | | 8 |
| 4 | 2 | 9 | 6 | 1 | | 3 | 8 | 7 |
| | | | 2 | | 9 | | | |
| 5 | 8 | 6 | | 3 | 4 | 9 | 1 | 2 |
| 2 | | 1 | 3 | 6 | 8 | | 4 | 9 |
| 8 | | 4 | | | | 5 | | 3 |
| 3 | | 7 | 4 | 5 | 2 | 8 | 6 | |

### ප්‍රහේලිකාව ගැන...

1. කුඩා කොටු නවයකින් සමන්විත වූ විශාල කොටුවක් නිර්මාණය වී ඇති අතර එවැනි කොටු නවයකින් මෙම ප්‍රහේලිකාව සම්පූර්ණ වී ඇත.
2. කුඩා කොටු නවය තුළ 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර, එය පිළිවෙලකට අවශ්‍ය නොවේ.
3. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටු නවය සම්පූර්ණ කළ පසු 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතුය.
4. ඉහත සඳහන් පරිදි ප්‍රහේලිකාව සම්පූර්ණ කළ පසු සිරස් සහ තිරස්, හරස් අතට 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර පිළිවෙලකට අවශ්‍ය නොවේ.
5. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටුවක හා තිරස් සිරස් හා හරස් අතට එකතු වේ අගය 45 ක් විය යුතුය.
6. කුඩා කොටුවක් තුළ හෝ සිරස්, තිරස් හා හරස් අතට අංක යෙදීමේදී එකම අංකය දෙතැනක සඳහන් නොකළ යුතුයි. සඳහන් කළ හැක්කේ එක් වරකි.

# වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 51

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 8 | 4 | 7 | 1 | 2 | 9 | 3 | 6 | 5 |
| 9 | 6 | 2 | 7 | 5 | 3 | 4 | 8 | 1 |
| 3 | 5 | 1 | 4 | 8 | 6 | 2 | 9 | 7 |
| 5 | 2 | 8 | 3 | 4 | 1 | 6 | 7 | 9 |
| 4 | 9 | 6 | 2 | 7 | 8 | 5 | 1 | 3 |
| 1 | 7 | 3 | 9 | 6 | 5 | 8 | 4 | 2 |
| 2 | 1 | 4 | 6 | 3 | 7 | 9 | 5 | 8 |
| 7 | 3 | 5 | 8 | 9 | 4 | 1 | 2 | 6 |
| 6 | 8 | 9 | 5 | 1 | 2 | 7 | 3 | 4 |

## මෙවර ජයග්‍රාහකයන් නොමැත

## තරඟ කොන්දේසි

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරඟයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගී විය නොහැක.
3. පළමුවන, දෙවන හා තුන්වන ජයග්‍රහන හිමිකර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙළින් රු. 1000/-, රු.750/-, රු.500/- වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණ අවසාන තීරණය ලෙස සැලකේ.
5. නිවැරදි පිළිතුරුපත් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගි දීම සිදු කෙරේ.
6. පිළිතුරුපත් එවන ලියුම් කවරේ වම් පස උඩ කෙලවරේ වයිට් හැකල් ප්‍රහේලිකා අංක 54 යනුවෙන් සඳහන් කළ යුතුයි.

ලිපිනය : වයිට් හැකල් කර්තෘ,
වයිට් හැකල් ප්‍රකාශන අංශය,
රෙජිමේන්තු මූලස්ථානය, ශ්‍රීලපාහ, යුද්ධ හමුදා ජනපදය,
පනාගොඩ,
හෝමාගම.

# මවයි මගේ බිරිඳ අගෙ

ද්වයි සිත මගෙ වේදනාවෙන් මවත් පියතුම නැති වූ සෝකේ
ඔයයි අද සිට පියත් මවුනුත් යලිදු ලැබදුන් මගේ ලෝකේ
මවයි ඔබ මට සැම දිනකම රැකීම් නැත කිසි බියක් ජීකේ
සුවයි ඔබ ළග සිටින සැම විට මගෙ නෙතටනම් නැත වි වේකේ

දෝණි සමගින් මවක් ලෙස ඔබ විදින දුක මගෙ නෙත ගැටෙන සඳ
ඕනි මට ඔබ ළග හිඳින්නට සැම දිනකම ඔබේ දුක මැද
හානි වන්නට එපා අප ආදරය කිසි දින සැමගෙ වස් වැද
ගෝණි ගණනින් ලබා දෙමු අපි ආදරය සැම දෙනට පොදි බැද

මගේ නිවසේ ශ්‍රියා කත ලෙස ඔබව පිළිගම් මා විසින්
තගේ නුඹ මට තවත් දැනක් වේවි දුක දකිමින් ඇසින්
ඇගේ රුව හිමි පුංචි දූ පැටියෙක් ද ලැබ දී ඇත කුසින්
අගේ ඇති ඔබෙ ස්වාමියා වෙමි රකිමි ඔබ පියතුම ලෙසින්

සෙ/329809 සාසෙ උදය කුමාර ජීඑල්ආර්
තුවාක අංශය ශ්‍රීලපාහ

## වයිට් හැකල් ප්‍රහේලිකාව

## 54

## කූපනය

අංකය :.................................

නිලය :.................................

නම :.................................

රාජකාරී ලිපිනය : .................................
.................................
.................................

ඒකකය : .................................

ජාතික හැඳුනුම්පත් අංකය : .................................

# WAR HEROES MEMORIAL SRI LANKA LIGHT INFANTRY

අප සමග උරෙන් උර ගැටී සටන්බිමේ පෙරමුණ ගෙන ක්‍රියා කර ප්‍රාණදානයෙන් ඇප කැප වූ නිලධාරින් හා සෙබළුන් 3807 දෙනෙකු සදා අනුස්මරණය කිරීම සඳහා රෙජිමේන්තු අධිපතිතුමන් ගේ සංකල්පයකට අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරින් ජ්‍යෙෂ්ඨ සේවා අත්දැකීම් ඇති විශ්‍රාමිකයින් හා සියළුම සෙබළුන්ගේ දිරිමත් කිරීම් හා ශ්‍රම ධන පරිත්‍යාගයෙන් යුතුව ඉදිවන රණවිරු ස්මාරකයේ ඉදිකිරීම් කටයුතු සිදු වන ආකාරය ඡායාරූපවලින් දැක්වේ.









# ශ්‍රීලපාහ විරුවන්ගේ හයිටි සමාජ සත්කාර

16 වන එක්සත් ජාතින්ගේ සාමසාධක බළඇණිය 2012.09.10 වන දින සිට හයිටි රාජ්‍යයේ සාමසාධක රාජකාරි වල නිරත වෙමින් සිටි. 2010 වසරේ ඇතිවූ භූමි කම්පාව හේතුවෙන් විනාශ වූ හයිටි රාජ්‍යය හා දීර්ග කාලයක සිට පවතින දේශපාලනික හා සමාජ ගැටළු හේතුවෙන් බිඳ වැටී ඇති හයිටි ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම වෙනුවෙන් මෙම බළඇණිය වෙතින් සිදු කරනු ලබන රාජකාරින්ට අමතරව හයිටි ජනතාව වෙනුවෙන් ප්‍රජා සත්කාර කටයුතුද සිදු කරනු ලබයි. ඒ අනුව වෛද්‍ය සායන පැවැත්වීම, සිවිල් ජනතාව සමග සහයෝගයෙන් පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කාරීම, පානීය ජලය බෙදාහැරීම, ළමුන් වෙනුවෙන් නිම් ඇඳුම් බෙදාදීම, තරුණයන් සඳහා ක්‍රීඩා තරග සංවිධානය කිරීම හා ත්‍යාග ලබාදීම, ජලය පිරිසිදු කර ගැනීමේ උපකරණ ලබාදීම, මෙම ප්‍රජා සත්කාර වැඩසටහනක් වලට අමතරව හයිටි තරුණ තරුණියන් වෙනුවෙන් මේ වන විට පුහුණු පාඨමාලාවන් ආරම්භ කර පවත්වාගෙන යන අතර, මුලික පරිඝණක පුහුණු පාඨමාලාව මෙන්ම යාන්ත්‍රික කාර්මික පුහුණු පාඨමාලාව ඉදිරියේදි මෙන්ම විවිධ වෘත්තීය පාඨමාලාවන් පැවැත්වීමට සැලසුම් කර ඇත.

මෙම කටයුතු මිනුස්ථා මුලස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ මෙන්ම හයිටි ජනතාව අතර ද, ප්‍රශංසාවට ලක්ව ඇත. මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් පිඩාවට ලක්ව සිටින හයිටි ජනතාවගේ ජන ජීවිතය නගා සිටුවීමට ඉවහල් වනු ඇත.

**මූලස්ථානය 16 එජාසාසාබ**









# රෙම ශ්‍රීලපාහ සංචාරය සිදු කළ මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීඑල්පී වික්‍රමසිංහ ආර්එස්පී



ස්වෙච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පී වික්‍රමසිංහ ආර්එස්පී 2012 අගෝස්තු මස 04 වන දින රෙම ශ්‍රීලපාහ සංචාරයක් සිදු කරන ලදී. රෙජිමේන්තුව වෙතින් මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි හට කඳවුරු සම්මාන මුරයක් සහ රෙජිමේන්තු වර්ණ ධජ සහිත සම්මාන පෙළපාළියක් පිරිනමා පිළිගන්නා ලදී. ඉන්පසු රෙජිමේන්තු බළලත් නිලධාරි සහ සැරයන් නිවස්නය වෙතින් ද තේ පැන් සංග්‍රහයක් ලබා දෙන ලදී.

රෙජිමේන්තුවේ සිටි සියලුම නිලයින් ඇමතීම ද ස්වෙච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක තුමා විසින් සිදු කර ජ්‍යෙෂ්ඨ නිලධාරින් සමඟ සමූහ ඡායාරූපයක් ගැනීමට ද අමතක නොකළේය..

**වයිට් හැකල් ප්‍රකාශන අංශය රෙම ශ්‍රීලපාහ**







